# කාර්ය සාධන වාර්තාව - 2016

**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**
**මහා භාණ්ඩාගාරය**
**මුදල් අමාත්‍යාංශය**
**කොළඹ - 01**

# පටුන

**1. හැඳින්වීම**………………………………………………………………………….. 1
1.1 සංවිධාන රාමුව……………………………………………………………………..1
1.2 දැක්ම……………………………………………………………………………….. 1
1.3 මෙහෙවර……………………………………………………………………………. 1
1.4 අරමුණු………………………………………………………………………………. 1
1.5 අභිමතාර්ථ………………………………………………………………………….. 2
1.6 සංවිධාන ව්‍යුහය…………………………………………………………………….. 3
1.7 කාර්යයන් 4
1.7.1 වෙළඳ ප්‍රතිපත්ති අංශය…………………………………………………………….. 4
1.7.1.1 වෙළඳ ප්‍රතිපත්ති………………………………………………………….... 4
1.7.1.2 තීරුබදු ප්‍රතිපත්ති………………………………………………………….. 4
1.7.1.3 නිදහස් වෙළඳ ගිවිසුම්……………………………………………………. 5
1.7.2 ආයෝජන ප්‍රතිපත්ති අංශය………………………………………………………… 5
1.7.3 පරිපාලන හා මූල්‍ය අංශය………………………………………………………… 6
**2. වෙළඳ ප්‍රතිපත්ති හා ආයෝජන අංශය**…………………………………………… 7
2.1. වෙළඳ ගිවිසුම්……………………………………………………………………… 7
2.1.1 වෙළඳ ගිවිසුම් යටතේ ප්‍රගතිය……………………………………………………. 8
2.1.1.1 ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)… ……………………….. 8
2.1.1.2 පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)… ………………… 9
2.1.1.3 දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)… …………………… 9
2.1.1.4 ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) ……………………………….. 11
2.1.1.5 බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහු ආංශික නිදහස් වෙළඳ ගිවිසුම (BIMSTEC)… ……………………13
2.1.1.6 යෝජිත චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම……………………………. 15
2.1.1.7 යෝජිත සිංගප්පූරු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම……………………… 16
2.1.1.8 යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA)… ………….. 16
2.2 නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අන්තර්ජාතික වෙළඳාම…………………………… 16
2.3 වෙළඳාම් පහසුකරණය……………………………………………………………17
2.4 ආනයන තීරුබදු ව්‍යුහය…………………………………………………………… 18
2.4.1 සංයෝජිත වර්ගීකරණය සඳහා 2016 දී ඇතුලත් කරන ලද උප ඒකක……………… 19
2.4.2 1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ පනත යටතේ සිදුකරන ලද සංශෝධනයන්.. 19
2.4.3 2007 අංක 48 දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) පනත……………………… 19
2.5 බදු කපාහැරීම්……………………………………………………………………….. 20
2.6 වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය…………………………………………………… 21
2.7 ආයෝජන………………………………………………………………………….. 21
2.7.1 විදේශ රටවල කරනු ලබන අයෝජන…………………………………………… 21
2.7.3 විනිමය පාලන පනත සම්බන්ධ කටයුතු………………………………………. 24
2 .8 ජාත්‍යන්තර සහයෝගිතාවය……………………………………………………….. 24
2.8.1 සාර්ක් සංවර්ධන අරමුදල (SDF)…… …………………………………….. 24
2.8.2. සාර්ක් මූල්‍ය රැස්වීම්………………………………………………………. 25
2.9 බන්ධිත භාණ්ඩ…………………………………………………………………… 26
**3. පරිපාලන හා මූල්‍ය කාර්ය සාධනය**………………………………………….. 28
3.1 පාලන අංශය……………………………………………………………………….. 28
3.2 විශේෂ ව්‍යාපෘති යෝජනාක්‍රම………………………………………………………. 34
3.2.1 රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම………………. 34
3.2.2 රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම………………………………………… 34
3.3 මූල්‍ය අංශය………………………………………………………………………. 34
3.4 විගණන විමසුම්…………………………………………………………………….. 35

**4. ඇමුණුම්**........................................................................... 36

ඇමුණුම I සංයෝජිත වර්ගීකරණ සඳහා ජාතික උප බෙදුම් - 2016 ..................... 36
ඇමුණුම II 1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ ආඥා පනත (රේගු ආනයන තීරුබදු).. 40
ඇමුණුම III රේගු ආඥා පනත (235 අධිකාරය) යටතේ සිදු කළ වෙනස්කම් .................. 42
ඇමුණුම IV විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත් අංක 48/2007 යටතේ බදු සංශෝධනය කිරීම්43

# වගු


| | | |
|---|---|---|
| වගුව 2.1 | ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව වෙනුවෙන් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2015 / 2016 | 08 |
| වගුව 2.2 | පකිස්තාන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2015 / 2016 | 09 |
| වගුව 2.3 | එක් එක් සාමාජික රට විසින් II අදියර යටතේ පවත්වාගෙන යන සංවේදි ලැයිස්තුව සහ III අදියර යටතේ අඩු කිරීමට එකඟ වූ ප්‍රතිශත | 10 |
| වගුව 2.4 | දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව වෙනුවෙන් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2015 / 2016 | 11 |
| වගුව 2.5 | තෙවන වටයේ සාකච්ඡා වලදී ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ සාමාජික රටවල් විසින් ලබා දුන් පොදු සහ විශේෂ සහන | 12 |
| වගුව 2.6 | ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව වෙනුවෙන් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2015 / 2016 | 13 |
| වගුව 2.7 | ගිවිසුම් ගත වූ විගස තීරු බදු ලිහිල් කිරීම | 14 |
| වගුව 2.8 | සාමාන්‍ය පරිදි තීරු බදු ලිහිල් කිරීම | 14 |
| වගුව 2.9 | බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ සහ ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුආංශික නිදහස් වෙළඳ ගිවිසුම සඳහා බදු නිදහස් කරන උප ලේඛනය | 14 |
| වගුව 2.10 | 2016 වර්ෂය තුළ ශ්‍රී ලංකාව විසින් වෙළඳ ගිවිසුම් යටතේ කරන ලද ආනයන සහ අපනයන | 16 |
| වගුව 2.11 | 2016 දෙසැම්බර් 31 දිනට තීරුබදු ව්‍යුහය | 18 |
| වගුව 2.12 | 2009 සිට 2016 දක්වා තීරුබදු ව්‍යුහය තුළ සිදු කරන ලද වෙනස්කම් | 19 |
| වගුව 2.13 | 2016 වර්ෂයේදී රේගු ආඥා පනතේ 19 (අ) වගන්තිය යටතේ දී ඇති තීරුබදු සහන | 20 |
| වගුව 2.14 | රේගු ආඥා පනතේ 19 (අ) වගන්තිය යටතේ පොදු තීරුබදු කපා හැරීම | 20 |
| වගුව 2.15 | 2016 වසරේදී අනුමැතිය ලබා දී ඇති විදේශීය බාහිර ආයෝජන | 22 |
| වගුව 2.16 | 2016 වසරේදී විදේශ ආයෝජන ඉවත්කර ගැනීම සඳහා ලබාදුන් අනුමැතීන් | 22 |
| වගුව 2.17 | 2016 වර්ෂයේදී අනුමත කරන ලද විදේශ ආයෝජන | 23 |
| වගුව 2.18 | 2016 වසර තුළදී විදේශ විනිමය පාලන පනත යටතේ ලැබී ඇති අභියාචනා | 24 |
| වගුව 2.19 | 2016 දී පවත්වන ලද සාර්ක් සංවර්ධන අරමුදලේ රැස්වීම් | 25 |
| වගුව 2.20 | 2016 දී පවත්වන ලද සාර්ක් මූල්‍ය රැස්වීම් | 26 |
| වගුව 3.1 | 2016.12.31 දිනට අනුමත කාර්යමණ්ඩලය | 28 |
| වගුව 3.2 | 2016 වර්ෂයේදී දෙපාර්තමේන්තුවට සම්බන්ධවූ නිලධාරීන් | 29 |
| වගුව 3.3 | 2016 වසරේදී දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු වී ගිය නිලධාරීන් | 29 |
| වගුව 3.4 | 2016 වසරේදී පුහුණු පාඨමාලා/ අධ්‍යයන චාරිකා /විදේශ සම්මන්ත්‍රණ | 30 |
| වගුව 3.5 | දේශීය පුහුණු පාඨමාලා /අධ්‍යයන චාරිකා/සම්මන්ත්‍රණ - 2016 | 31 |
| වගුව 3.6 | 2016 වර්ෂය තුළ අයවැය ඇස්තමේන්තු උපයෝජනය | 35 |
| වගුව 3.7 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම 2016 | 35 |
| වගුව 4.1 | සංයෝජිත වර්ගීකරණ සඳහා ජාතික උප බෙදුම් - 2016 | 36 |
| වගුව 4.2 | 1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ ආඥා පනත (රේගු ආනයන තීරුබදු) | 40 |
| වගුව 4.3 | රේගු ආඥා පනත (235 පරිච්ඡේදය) යටතේ සිදු කළ වෙනස්කම් | 42 |
| වගුව 4.4 | විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත් අංක 48/2007 යටතේ බදු සංශෝධනය කිරීම් | 43 |

# 1. හැඳින්වීම

## 1.2 සංවිධාන රාමුව

2006 වර්ෂයේ ජුනි මාසයේදී මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත කර මුදල් අමාත්‍යාංශයේ මහ භාණ්ඩාගාරය යටතේ වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වශයෙන් නම් කරන ලද්දේ රටේ ආර්ථිකය ජාත්‍යන්තරය හා ඒකාබද්ධකරණය ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැපයීමේ පුළුල් පරමාර්ථයෙනි.

ශ්‍රී ලංකා ආර්ථිකයේ සහ ජනතාවගේ යහසාධනය උදෙසා විදේශ වෙළඳාම, තීරුබදු සහ ආයෝජන සම්බන්ධයෙන් තිරසාර ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ. දෙපාර්තමේන්තුවේ කාර්යයන් වඩාත් පුළුල් කිරීම සඳහා "වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වශයෙන් "2012 වර්ෂයේදී නැවතත් නම වෙනස් කරන ලදි.

වර්ෂ 2016 දී වඩා ඵලදායි සේවාවක් ලබා දීම උදෙසා දෙපාර්තමේන්තුවේ උපායමාර්ගික දිශානතිය ප්‍රතිව්‍යුහගත කර එහි දැක්ම, මෙහෙවර, අරමුණු හා අභිමතාර්ථ මෙන්ම ආයතනික ව්‍යුහයද විධිමත්ව සකස් කරන ලදි.

දෙපාර්තමේන්තුව විසින් ස්වකීය ප්‍රධාන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් පරිදි අංශ තුනක් ස්ථාපනය කරන ලදි.

I. වෙළඳ ප්‍රතිපත්ති අංශය
II. ආයෝජන ප්‍රතිපත්ති අංශය
III. පරිපාලන, ගිණුම් හා විශේෂ ව්‍යාපෘතිඅංශය

## 1.2 දැක්ම

රටේ සමස්ත සංවර්ධනය උදෙසා වෙළඳාම හා ආයෝජනය තුළ ප්‍රගතිගාමී ප්‍රතිපත්ති ව්‍යාප්ත කිරීම සුරක්ෂිත කිරීම

## 1.3 මෙහෙවර

සමස්ථ සංවර්ධනය උදෙසා ජාත්‍යන්තර ආර්ථික වෙළඳ පද්ධතියට පහසුකම් සැලසීම සඳහා වෙළඳ හා ආයෝජනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.


## 1.4අරමුණු

- කලාපය තුළ සෘජු විදේශ ආයෝජන සඳහා කේන්ද්‍රස්ථානය ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම
- ව්‍යාපාර පහසු කිරීම් දර්ශකය අනුව ශ්‍රී ලංකාව පලමු රටවල් 50 අතරට ගෙන ඒම
- කර්මාන්ත හිතකාමී තීරු බදු ක්‍රමවේදයක් ඇති කිරීම
- වර්ෂ 2020 වනවිට ඇමරිකානු ඩොලර් බිලියන 25 ක් වෙළඳ ආර්ථිකයක් ලෙස ප්‍රවර්ධනය කිරීම
- රාජ්‍ය අංශයේ සේවකයන්ට සහනදායී වාහන බලපත්‍ර නිකුත් කිරීම
- තරඟකාරී වාසියක් ලැබෙන පරිදි වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම

## 1.5 අභිමතාර්ථ

- ආයෝජන අධෛර්යමත් කිරිමට ඇති බාධක ඉවත් කිරීම
- අපනයන සැකසුම් යෝජනා ක්‍රම සඳහා තාවකාලික ආනයනය කිරීම් හා බන්ධිත ගුදම් ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායික අංශය සඳහා ප්‍රතිපත්තියක් සැකසීමට අදාළ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා සංවිධානය කිරීම
- කුඩා පරිමාණ ව්‍යවසායකයන් මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් දක්වාත් මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් මහාපරිමාණය දක්වා උසස් කිරීමට යාන්ත්‍රණයක් හඳුන්වා දීම
- 2018 වර්ෂය වනවිට චීනය,ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපීය හවුල සමඟ නිදහස් වෙළඳ ගිවිසුම්වලට එළඹීම
- සේවාදායක හිතකාමී දත්ත පද්ධතියක් හරහා අවශ්‍ය තොරතුරු සපයමින් ව්‍යවසායකයින්ට සහයෝගය දැක්වීම
- බාහිර ආයෝජකයන් සඳහා නෛතික මාර්ගෝපදේශයක් සකස් කිරීම
- රාජ්‍ය නිලධාරීන්හට සහනදායී වාහන බලපත්‍ර නිකුත් කිරීම විධිමත් කිරීම
- තීරුබදු වලට අදාළ ගැටළු 10% ට වඩා අවම කිරීම
- රටේ වෙළඳ ආර්ථිකයේ අසමමිතික ස්වභාවය තුළ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ පදනම් කරගෙන නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම
- ගෝලීය වාසිසහගත වෙළඳාම/කර්මාන්ත වලට ප්‍රවේශවීමට ඉඩ සලසන්නාවූ නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම

1.6 සංවිධාන ව්‍යුහය


අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
රේගු උපදේශක
අධ්‍යක්ෂ (වෙළඳ)
අධ්‍යක්ෂ (පාලන)
අධ්‍යක්ෂ (ආයෝජන)
ස.අ - I (වෙළඳ)
ස.අ- II (වෙළඳ)
ස.අ-III (වෙළඳ)
ස.අ (සැලසුම්)
ස.අ (පාලන)
ස.අ(විශේෂ ව්‍යාපෘති)
ස.අ (මුදල්)
ස.අ. (ආයෝජන)
ස.අ (ආයෝජන)
තො.ත.නි. 2
ප.නි.1
ප.ස/සං.නි 1
ප.ස/සං.නි 1
ප.ස/සං.නි 1
ප.ස/සං.නි 1
ප්‍ර.ක.ස
ප.ස/සං.නි 2
ප.ස/සං.නි 1
ප.ස/සං.නි 1
ක.සහකාර 1
ක.සහකාර 1
ක.සහකාර 2
ක.සහකාර 1
ක.ස/පෞ. ස
ක.සහකාර 2
ක.සහකාර 3
ක.සහකාර 1
ක.සහකාර 2
රියදුරු - 5
කාර්යාල සහායක සේවය -8

## 1.7 කාර්යයන්

### 1.7.1 වෙළඳ ප්‍රතිපත්ති අංශය

වෙළඳ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා වෙළඳ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම මෙන්ම වෙළඳාමට, කර්මාන්තයන්ට හා නිදහස් වෙළඳ ගිවිසුම් වලට අදාලව විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධ කටයුතු මෙම අංශය යටතේ සිදු කරයි. තවද රේගු පරිපාලනයට අදාල රෙගුලාසි හා අභියාචනා සම්බන්ධයෙන් වූ කාර්යන් ඉටුකිරීම. වෙළඳ අංශය යටතේ ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත දක්වා ඇත.

#### 1.7.1.1 වෙළඳ ප්‍රතිපත්ති

i. තීරුබදු ප්‍රතිපත්ති වලට අදාළ ගැටලු හා විකල්ප විශ්ලේෂණය කිරීම
ii. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත බලාත්මක කිරීම
iii. තීරුබදු ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම
iv. ව්‍යාපෘති පදනම යටතේ මෝටර් රථ ආනයන ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම
v. වෙළඳ/ව්‍යාපාර සංසද සංවිධානය කිරීම
vi. වෙළඳ ප්‍රතිපත්ති සම්බන්ධ පාර්ශව අතර කතිකාවත් ඇතිකිරීම
vii. වෙළඳාමට හෝ තීරුබදු වලට අදාළ ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම
viii. පාර්ශවකරුවන් ඉදිරිපත් කරනු ලබන වෙළඳ හෝ තීරුබදු ප්‍රතිපත්ති වලට අදාළ ගැටළු විසඳීම
ix. අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන වෙළඳ හෝ තීරුබදු ප්‍රතිපත්ති ප්‍රකාශ වැඩිදියුණු කිරීම
x. මුදල් අමාත්‍යාංශය ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ඒජන්සිය නියෝජනය කිරීම
xi. පාර්ලිමේන්තු කටයුතු මත තීරුබදු ප්‍රතිපත්ති
xii. වෙළඳ හෝ තීරුබදු ප්‍රතිපත්තිවලට අදාළ අධිකරණ නඩු වලට පිළිතුරු සම්පාදනය කිරීම
xiii. අමාත්‍ය මණ්ඩල සංදේශ/නිරීක්ෂණ/ සටහන් සකස් කිරීම

#### 1.7.1.2 තීරුබදු ප්‍රතිපත්ති

i. 19 (අ) වගන්තිය යටතේ තීරුබදු ඉවත් කිරීම සමායෝජනය කිරීම
ii. 19 (අ) වගන්තිය යටතේ වන තීරු බදු ඉවත් කිරීම සඳහා තොරතුරු පද්ධතියක් පිහිටුවීම
iii. රේගු ආඥා පනත යටතේ රෙගුලාසි සම්පාදනය සඳහා පහසුකම් සැලසීම
iv. ආදායම් සංරක්ෂණ ආඥාව ප්‍රකාශයට පත් කිරීම (RPO)
v. තීරුබදු විෂමතා වලට අදාල දුක් ගැනවිලිවලට විසඳුම් ලබාදීම
vi. සංයෝජිත වර්ගීකරණය ජාතික උප බෙදීම් කළමනාකරණය
vii. තක්සේරු කිරීම් ඇතුළුව රේගු නඩු පිළිබඳ අභියාචන සමාලෝචනය කිරීම
viii. රේගු පරිපාලනය පිළිබඳ විගණන වාර්තා සමාලෝචනය කිරීම
ix. සංයෝජිත වර්ගීකරණ කේත අංක වලට අනුකූලවීම සහ අන්‍යෝන්‍ය ස්ථාපනය
x. විශේෂ වෙළඳ භාණ්ඩ පනත ක්‍රියාත්මක කිරීම
xi. අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය (TIEP) පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම
xii. බන්ධිත ගුදම් පහසුකම් පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම
xiii. අයවැය යෝජනා සකස් කිරීම
xiv. අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

### 1.7.1.3 නිදහස් වෙළඳ ගිවිසුම්

i. නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ක්‍රියාත්මක වන මූල්‍ය ප්‍රතිපත්ති විශ්ලේෂණය
ii. වෙළඳ හා තීරුබදු පිළිබඳ කරුණු වලදී ආර්ථික කළමනාකරණ කමිටුව සමඟ සම්බන්ධීකරණය කිරීම
iii. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම්වලට සමාන්තරව වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම
iv. පහත සඳහන් ගිවිසුම් සම්බන්ධයෙන් තීරුබදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

- ඉන්දියා ශ්‍රීලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පාකිස්තාන ශ්‍රීලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS)
- ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුපාර්ශවීය ගිවිසුම (BIMSTEC)
- යෝජිත චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA), ශ්‍රී ලංකා සිංගප්පූරු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (SLSFIA) හා ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම (ETCA)
- ඒකාබද්ධ වෙළඳ කමිටු සම්බන්ධවීම (කෙන්යාව, වියට්නාමය, ජපානය, රුසියාව ආදිය)

### 1.7.2 ආයෝජන ප්‍රතිපත්ති අංශය

රාජ්‍ය ආයතනවල ආයෝජන සම්බන්ධ ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධ වගකිම ආයෝජන ප්‍රතිපත්ති අංශයට අදාල වේ. මෙම අංශයට පවරා ඇති ප්‍රධාන කාර්යයන් පහත දක්වා ඇත.

i. විදේශීය හා දේශීය ආයෝජන පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම
ii. විදේශ ආයෝජන සම්බන්ධයෙන් නෛතික කරුණු පිළිබඳ සොයා බැලීම
iii. මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් විනිමය පාලන පනත යටතේ අභියාචනා සැලකිල්ලට ගැනීම
iv. ශ්‍රී ලංකාවේ මූල්‍ය බුද්ධි ඒකකයට අවබෝධතා ගිවිසුම්වලට එළඹීම සඳහා අනුමැතිය ලබාදීම
v. විනිමය පාලන පනත, සම්බන්ධයෙන් සියළුම අනුමැතීන් ලබාදීම
vi. මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, මුදල් විශුද්ධිකිරීම වැලැක්වීමේ පනත සහ ත්‍රස්තවාදී මූල්‍ය වැලැක්වීමේ පනත පිළිබඳ සම්මුතිය සම්බන්ධයෙන් සියලුම අනුමැතීන් ලබාදීම
vii. බන්ධිත ගුදම් සඳහා අනුමැතිය
viii. බන්ධිත ගුදම් පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම
ix. අදාළ පාර්ශවකරුවන් සමග බන්ධිත ගුදම් ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම
x. අදාල පාර්ශවකරුවන් සමග දේශීය හා ආයෝජන ප්‍රතිපත්ති රාමුවක් වැඩිදියුණු කිරීම
xi. ආයෝජන මණ්ඩල පනතට අදාළ කාරණා පිළිබඳ සොයා බැලීම
xii. ආයෝජන මණ්ඩලයේ නිෂේධන ලැයිස්තුවේ අයිතමයන් පිළිබඳ එකඟතාවය ලබාදීම

xiii. අපනයන සැකසුම් සඳහා තවකාලික ආනයන යෝජනා ක්‍රමයට අදාළ කරුණු පිළිබඳව සොයා බැලීම

xiv. අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය සඳහා නව ප්‍රතිපත්ති රාමුවක් සමාලෝචනය කර සංවර්ධනය ඇති කිරීමට සහයෝගය දැක්වීම

xv. පෞද්ගලික රාජ්‍ය බද්ධ ව්‍යාපාර වලට අදාල කරුණු පිළිබඳ සොයා බැලීම

xvi. සාර්ක් සංවර්ධන අරමුදලට අදාළ සියළුම කටයුතු පිළිබඳ සොයා බැලීම

xvii. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට සහ පොදු රාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලයට අදාළ සියළුම කටයුතු සොයා බැලීම

xviii. අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම

xix. ආයෝජනයට අදාළ අයවැය යෝජනා සකස් කිරීම

xx. අමාත්‍ය මණ්ඩල සංදේශ - නිරීක්ෂණ සහ සටහන් සකස් කිරීම

### 1.7.3 පරිපාලන හා මූල්‍ය අංශය

මානව, භෞතික හා මූල්‍ය සම්පත් කළමනාකරණය කිරීම පරිපාලන හා මූල්‍ය අංශයට අයත් වගකීම් වේ. ඒ යටතේ දෙපාර්තමේන්තුව වෙත නිලධාරීන් බඳවා ගැනීම, පුහුණු හා සංවර්ධනය කිරීම හා ඔවුන් දෙපාර්තමේන්තුව තුළ ස්ථානගත කිරීම සිදුකරනු ලබයි. භෞතික හා මූල්‍ය සම්පත් කළමනාකරණය යටතේ භෞතික හා මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම, නඩත්තු කටයුතු හා වාර්තා පවත්වාගෙන යාමේ කාර්යයන් ආවරණය කරනු ලබයි.

## 2. වෙළඳ ප්‍රතිපත්ති හා ආයෝජන අංශය

ප්‍රතිපත්ති විශ්ලේෂණය, තීරුබදු ප්‍රතිපත්ති ඇතුළු ප්‍රතිපත්ති සම්පාදනය හා අන්තර්ජාතික හා දේශීය වෙළඳපලෙහි ප්‍රවනතා මෙන්ම ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික හා රටවල් කිහිපයකින් යුක්ත වූ ගිවිසුම්වල විෂය සීමාව තුල අන්තර්ජාතික බැඳීම්වලට අනුව එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග හා මාර්ගෝපදේශ නිකුත්කිරීම වෙළඳ ප්‍රතිපත්තියට ඇතුලත්වේ.

### 2.1. වෙළඳ ගිවිසුම්

ශ්‍රී ලංකාව, එක්සත් රාජධානිය, යුරෝපීය සංගමය, චීනය, ඉන්දියාව, කැනඩාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය හා ජපානය ඇතුළු තම වැදගත් වෙළඳ හවුල්කරුවන් සමඟ වෙළඳ සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ආයතනික රාමුව වන්නේ ලෝක වෙළඳ සංවිධානයයි (WTO).

ශ්‍රී ලංකාව, 1995 දී ලෝක වෙළඳ සංවිධානය (WTO) ස්ථාපනය කරන ලද අවස්ථාවේ එහි ආරම්භක සාමාජිකයෙකු විය. ඊට ප්‍රථම, ශ්‍රී ලංකාව, තීරුබදු හා වෙළඳාම පිළිබඳ පොදු ගිවිසුමේ (GATT) ආරම්භක සාමාජික රටවල් 23 අතර විය. ලෝක වෙළඳ සංවිධානය ඇතිකිරීම සඳහා මග සලසන ලද උරුගුවේ වෙළඳ සාකච්ඡා වටය GATT සංවිධානයේ අනුග්‍රහය යටතේ සිදුකරනු ලැබීය.

කෘෂිකර්මාන්තය, කෘෂිකාර්මික භාණ්ඩ වෙළඳාම, බැංකුකරණය, විදුලිසංදේශනය, කාර්මික ප්‍රමිතීන් හා නිෂ්පාදන ආරක්ෂණය, ආහාර සනීපාරක්ෂක රෙගුලාසි, රේගු තක්සේරුකරණය, බුද්ධිමය දේපළ හා වෙනත් ක්ෂේත්‍ර ඇතුලත්ව වෙළඳාම පාලනය කරනු ලබන ලෝක වෙළඳ සංවිධානයේ ගිවිසුම් මගින් වර්තමාන බහුපාර්ශ්වික වෙළඳ පද්ධතිය පාලනය කරනු ලැබේ. ලෝක වෙළඳ සංවිධාන රාමුව යටතේ වන වෙළඳාම, සාමාජිකයන් අතර හා දේශීය හා අන්තර්ජාතික වෙළඳාම ප්‍රතිපත්ති අනුව සමව සැලකීමේ න්‍යාය අනුව පාලනය වේ. නමුත්, නිදහස් වෙළඳ ගිවිසුම් හා යම් පාර්ශවයක් සඳහා පමණක් ප්‍රතිලාභ ලැබෙන වරණීය වෙළඳ ගිවිසුම් මෙම නීතියට පරිබාහිරව පවතී.

මෙම දෙපාර්තමේන්තුව ඵලදායී ලෙස ගිවිසුම්වලට එළඹීම හා ද්විපාර්ශික, බහුපාර්ශ්වික හා රටවල් කිහිපයකින් යුක්ත වූ වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම තුලින් අන්තර්ජාතික වෙළඳාම වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියේ අඛණ්ඩව නිරතව සිටී. ශ්‍රී ලංකාව හා ක්‍රියාත්මක ද්විපාර්ශික, බහුපාර්ශ්වික හා රටවල් කිහිපයකින් යුක්ත වූ වෙළඳ ගිවිසුම් වන්නේ,

- ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පකිස්තාන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ආසියානු ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)
- බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහු ආංශික නිදහස් වෙළඳ ගිවිසුම (BIMSTEC)

තරඟකාරී වෙළඳ පරිසරයක් තුළ දියුණු කළ හැකි කර්මාන්ත ආරක්ෂා කරමින් හා සංවර්ධනය කරමින් ඉහළ ඒක පුද්ගල ආදායමක් හා සංචාරක පාරාදීසයක් කරා ළඟා වීම මගින් ශ්‍රී ලංකාව වෙළඳ හා ආයෝජන කේන්ද්‍රස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම වෙළඳ ගිවිසුම් වලින් අපේක්ෂා කරන ප්‍රධාන අරමුණු වේ. සේවා වෙළඳාම ඉතා සංවේදී ක්ෂේත්‍රයක් බැවින් කෘෂිකාර්මික හා කාර්මික අංශවල කම්කරු ශ්‍රමය හිඟවීම සම්බන්ධයෙන් කල් ඇතිව පිළියම් යෙදිය යුතුය. ඒ අනුව, සුදුසු ආයෝජන ආකර්ශනය කරගැනීමට හා පුළුල් ආර්ථික සහයෝගීතාවයන් සඳහා රාමුවක් පිළියෙල කර ගැනීම මගින් සේවා සම්බන්ධ වෙළඳ කටයුතු සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමට වැඩි ප්‍රමුඛතාවයක් දෙනු ලැබීය.

### 2.1.1 වෙළඳ ගිවිසුම් යටතේ ප්‍රගතිය

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, වාණිජ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර වෙළඳ ගිවිසුම් යටතේ එකඟතාවයන්ට එළඹ ඇති පරිදි තීරුබදු සංශෝධන ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සිදුකරනු ලැබීය. ඒ අනුව, තීරුබදු නිදහස් කිරීමේ වැඩසටහනද ඇතුළුව වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රගතිය පහත දක්වා ඇත.

#### 2.1.1.1 ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)

1998 දෙසැම්බර් 28 වන දින අත්සන් කරන ලද ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම, ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම් මගින් පහසුකම් සලසන ලද ද්විපාර්ශ්වික වෙළඳාම හා ආයෝජන වැඩි දියුණු කිරීම මගින් ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ආර්ථික සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන 2000 මාර්තු 1 වන දින සිට ක්‍රියාත්මක වනු ලැබීය. රටවල් දෙක මගින් එකිනෙකෙහි අපනයන වෙළඳපල ප්‍රවේශය ලබාදීම සඳහා, ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම මගින් බදු නිදහස් පදනම මත හෝ සහනදායී පදනම මත රටවල් දෙක අතර භාණ්ඩ වෙළඳාම පමණක් ආවරණය කරනු ලැබේ.

මේ අනුව, එළවළු තෙල්, ප්‍රාථමික තඹ, මාගරින්, කිරිගරුඬ හා ගම්මිරිස් වැනි ප්‍රධාන අපනයනයන් අඩු වී ඇති අතර වෙනත් නිෂ්පාදන ගණනාවක්ම ඉන්දීය වෙළඳපලට ප්‍රවේශ වී ඇත. පරිවාරක කම්බි හා විදුලි රැහැන්, කුකුල් ආහාර, ටයර්, පිඟන් භාණ්ඩ, ඇඟළුම්, ගෘහ භාණ්ඩ, වායු සමීකරණ හා ශීතක, මිනුම් හා පරීක්ෂා කිරීමේ උපකරණ, වීදුරු බෝතල්, පිරිසැකසුම් කරන ලද මස් නිෂ්පාදන, මධ්‍යම ඝනත්ව තන්තු (MDF) බෝඩ්, රබර් අත්වැසුම්, තර්මල් පේපර්, ටයිල්, ගල් වර්ග හා කිරිගරුඬ, බොයිලේරු හා යන්ත්‍ර කොටස්, යකඩ හා වානේ භාණ්ඩ, පැනල් බෝඩ් හා ආවරණ, මළු හා බෑග් ආදිය ඊට ඇතුලත්වේ.

**වගුව 2.1 ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව වෙනුවෙන් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2015 / 2016**

| 2015 | | 2016 | |
|---|---|---|---|
| ආනයන | අපනයන | ආනයන | අපනයන |
| වටිනාකම (රු. මි.) | වටිනාකම (රු. මි.) | වටිනාකම (රු. මි.) | වටිනාකම (රු. මි.) |
| 32,676 | 60,539 | 27,216 | 57,576 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2015/2016*

ශ්‍රී ලාංකීය අපනයනකරුවන් විසින් ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ භාණ්ඩ අපනයනය කිරීමේදී මුහුණපාන තීරුබදු නොවන බාධක 16 ක් පිළිබඳව සඳහන් වාර්තාවක් 2016 දී විසඳුම් සඳහා ඉන්දියාව වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ පිළිබඳව දැනට සිදුකෙරෙන ද්විපාර්ශික වෙළඳ සාකච්ඡා යටතේ කටයුතු කරනු ඇත.

ඉන්දියාව තීරුබදු නොවන බාධක යෙදීම නිසා ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ අසාධාරණ ලෙස සීමා කෙරෙන බවද පෙන්වා දී ඇත.

**ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ කෝටා උපයෝජනය**

ශ්‍රී ලංකාව මගින් ඉන්දියාවට ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු ගාස්තු කෝටා ලබාදී නොමැත. තේ, ඇඟළුම්, ගම්මිරිස්, දිසිදි පොල් සහ මාගරින් සහ බේකරි නිෂ්පාදන සඳහා ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට තීරුබදු ගාස්තු කෝටා ලබා දී ඇත. 2016දී ශ්‍රී ලංකාව ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තේ සහ ඇඟළුම් ඉන්දියාවට අපනයනයේදී 50%කට වඩා කෝටා ප්‍රමාණයක් භාවිතා කර ඇත.

### 2.1.1.2 පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)

ශ්‍රී ලංකාව හා පකිස්තානය අතර ද්විපාර්ශ්වික වෙළඳාම සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩි කිරීම සඳහා පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම 2005 ජූනි 12 වන දින සිට බලාත්මක වේ.

ගම්මිරිස්, බීඩි කොළ, බුලත් කොල, පොල්කටු කැබලි, ස්වභාවික රබර්, පොල්, අමු හා වියලි කජු, ලී හා ලී බඩු, ආහාරයට ගන්නා ඵලවළු සහ තේ ශ්‍රී ලංකාවෙන් පකිස්තානයට ප්‍රධාන වශයෙන් අපනයනය කරයි. අන්නාසි, ක්‍රීඩා උපකරණ, ඇට සහිත සියඹලා, ආහාරයට ගන්නා තෙල්, පෝසිලේන් පිඟන් බඩු හා මුළුතැන්ගෙයි උපකරණ, සෙරමික් ටයිල්, ගෘහභාණ්ඩ, විදුලි ස්විච හා සොකට් ශාකසාර විලවුන් වර්ග හා ප්ලාස්ටික් භාණ්ඩ, තීන්ත, වීදුරු පින්තාරු, සම්භාණ්ඩ, ශීතකල මාළු, ඉස්සන්, පොකිරිස්සන්, කකුළුවන්, කැපූ මල් හා කොළ, මැණික් හා ස්වර්ණාභරණ හා විසිතුරු මසුන් ඇතුළු නව නිෂ්පාදන පෙලක් පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම මගින් පකිස්තානු වෙළඳපල වෙත ප්‍රවේශ කිරීමට අවකාශ සැලසී ඇත.

රටවල් දෙකම මගින් බදු නිදහස් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කර ඇති අතර එමගින් නිෂ්පාදන 4500 කට වැඩි ප්‍රමාණයක් සඳහා බදු නිදහස් වෙළඳපල ප්‍රවේශයක් දෙරටටම ලැබී ඇත. පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ රටවල් දෙක විසින් සිදුකරන ආනයන හා අපනයනවල වටිනාකම 2.2 වගුව මගින් දැක්වේ.

**වගුව 2.2 පකිස්තාන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2015 / 2016**

| 2015 | | 2016 | |
|---|---|---|---|
| ආනයන | අපනයන | ආනයන | අපනයන |
| වටිනාකම (රු. මි.) | වටිනාකම (රු. මි.) | වටිනාකම (රු. මි.) | වටිනාකම (රු. මි.) |
| 4,026 | 9,147 | 3,069 | 9,123 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2015/2016*

පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම, ආයෝජන, සේවා හා ආර්ථික සහයෝගීතාවය ඇතුලත් විස්තීර්ණ ගිවිසුමක් බවට පරිවර්තනය කිරීම සඳහා සාකච්ඡා කෙරෙමින් ඇත.

**පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ කෝටා උපයෝජනය**

වසරකට බාස්මතී සහල් මෙ.ටො. 6000ක් සහ අර්තාපල් මෙ.ටො. 1000ක් පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වූ තීරු බදු ගාස්තු කෝටා ක්‍රමය මගින් ශ්‍රී ලංකාවට අපනයනය කිරීම සඳහා පකිස්තානයට අවස්ථාව ලබා දී ඇත. එමෙන්ම, පකිස්තානය විසින් ශ්‍රී ලංකාවට ප්‍රධාන වශයෙන් තේ සහ ඇඟළුම් සඳහා තීරු බදු ගාස්තු කෝටා ලබා දී ඇත. නමුත්, තේ සහ ඇඟළුම් සඳහා යුරෝපීය වෙළඳපළ වඩාත් වාසිදායක වන බැවින්, ශ්‍රී ලංකාව විසින් පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ පකිස්තානය විසින් ලබා දී ඇති මුළු කෝටා ප්‍රමාණය සම්පූර්ණයෙන් උපයෝජනය කර නොමැත.

### 2.1.1.3 දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)

සාර්ක් කලාපයේ සාමාජික රටවල්වල අමාත්‍යවරුන්ගේ මණ්ඩලය මගින් 2004 ජනවාරි 6 වන දින පකිස්තානයේ ඉස්ලාමාබාද් නගරයේ දී දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම අත්සන් කරනු ලැබීය. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම සකස්කිරීමේ ප්‍රාරම්භක වැඩකටයුතු, ඒ සඳහා ස්ථාපනය කරනු ලැබූ සාමාජික රටවල විශේෂඥයින්ගෙන් සමන්විත විශේෂඥ කමිටුව වෙත පැවරී තිබුණි. 1995 දී දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම ඇති කිරීමත් සමඟ ආරම්භ කරන ලද වරණීය වෙළඳාම ප්‍රවර්ධනය හරහා බහු පාර්ශ්වික ආර්ථික ඒකාබද්ධතා වැඩසටහන තවදුරටත් වැඩිදියුණු කිරීම දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමෙහි අරමුණ වේ.

2009 දී කොළඹ දී පැවති 15 වන සාර්ක් සමුළුවේදී දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම අමාත්‍යවරුන්ගේ මණ්ඩලය මගින් සංවේදී ලැයිස්තුව සංශෝධනය කිරීම පිළිබඳව අවධාරණය කර ඒ සඳහා උපදෙස් දෙනු ලැබීය. ඒ අනුව සංවේදී ලැයිස්තුවේ ඇතුලත් භාණ්ඩ ගණන අඩුකිරීම සම්බන්ධයෙන් කටයුතු ආරම්භ කිරීම සඳහා ආවස්ථික ක්‍රියාකාරී කණ්ඩායමක් පත්කිරීම නිර්දේශ කර අනුමත කරනු ලැබීය. මෙම ක්‍රියාකාරී කමිටුවේ පළමු රැස්වීම 2010 පෙබරවාරි 10 වන දින පැවති අතර සංවේදී ලැයිස්තුවේ ඇති තීරුබදු ගණනාවක් අඩුකිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ ආදර්ශ සම්බන්ධයෙන් එහිදී සාකච්ඡා කරනු ලැබීය. සාමාජික රටවලට ද්විපාර්ශ්විකව ඔවුන්ගේ ඉල්ලීම් ලැයිස්තුව පිළියෙල කර ලේකම් කාර්යාලයට දන්වන ලෙස රැස්වීමේදී නිර්දේශ විය. එකී ඉල්ලීම් ඉදිරිපත්වීමත් සමඟම සාමාජික රටවල් මගින් ඔවුන්ගේ මූලික පිරිනැවුම් ලැයිස්තුව සාර්ක් ලේකම් කාර්යාලය හරහා සියළුම සාර්ක් රටවල් වෙත යොමුකරනු ඇත. ක්‍රියාකාරී කණ්ඩායමේ ඊළඟ රැස්වීමේදී ඉල්ලීම් හා පිරිනැමීම් ලැයිස්තුව සම්පූර්ණ කිරීම සඳහා තවදුරටත් විස්තරාත්මකව සාකච්ඡා කරනු ඇත.

වෙළඳාම හා සේවා සැපයුම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS)පිළිබඳ විශේෂඥ කණ්ඩායමේ 5 වන රැස්වීම 2010 පෙබරවාරි මාසයේදී නේපාලයේ කත්මන්ඩු හි පිහිටි සාර්ක් ලේකම් කාර්යාලයේදී පැවැත්විණි. මෙම රැස්වීමේදී විශේෂඥ කණ්ඩායමේ හතරවන රැස්වීමේදී සංශෝධනය කරන ලද මීලග සාර්ක් සමුළුවේදී සාමාජික රටවල නායකයින් විසින් අත්සන් කිරීමට නියමිත වූ වෙළඳාම හා සේවා සැපයුම පිළිබඳ සාර්ක් ගිවිසුමේ කෙටුම්පත සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලැබිය. ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව බැඳීම් පිළිබඳ විශේෂ වැඩසටහන් පිළිබඳව සාකච්ඡා කිරීමට ද එම රැස්වීමේදී එකඟ විය. ඒ අනුව, 2010 අප්‍රේල් 29 වන දින භූතානයේ පැවති 16 වන සාර්ක් සමුළුවේදී සාමාජික රටවල නායකයින් විසින් වෙළඳාම හා සේවා සැපයුම පිළිබඳ සාර්ක් ගිවිසුම් අත්සන් කරනු ලැබූ අතර ශ්‍රී ලංකාව 2010 ජූනි 2 වන දින මෙම ගිවිසුම පිළිගනු ලැබිය.

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වන තීරුබදු නිදහස් කිරීමේ වැඩසටහනේ (TLP) 1 අදියර 2015 දී නිමකරනු ලැබිය. තීරුබදු නිදහස් කිරීමේ වැඩසටහනේ II වන අදියර 2018 දෙසැම්බර් අවසානයේදී සම්පූර්ණ කිරීමට නියමිතය. මෙම II වන අදියර යටතේ ශ්‍රී ලංකාව විසින් දැනට පවත්නා තම නිෂේධ ලැයිස්තුවේ සඳහන් අයිතම 208 ක් සඳහා වූ තීරුබදු අඩු කිරීමට එකඟ වී ඇත.

2016 දී පකිස්තානයේ පැවති සංවේදී ලැයිස්තුව අඩුකිරීම සම්බන්ධ තෙවන ක්‍රියාකාරී කණ්ඩායම් සාකච්ඡාවේදී III වන අදියරේදී දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වූ සංවේදී ලැයිස්තුව තවදුරටත් අඩු කිරීමට එකඟ විය. ඒ අනුව, III වන අදියරේදී දැනට පවත්නා තම නිශේධ ලැයිස්තුව තවදුරටත් 10% කින් අඩු කිරීමට ශ්‍රී ලංකාව එකඟ වී ඇත.

සංවේදී ලැයිස්තුවේ වූ අයිතම සංඛ්‍යාව හා III වන අදියර යටතේ සාමාජික රටවල් විසින් අඩු කිරීමට එකඟ වී ඇති ප්‍රතිශතයන් පහත වගුවේ දක්වා ඇත.

**වගුව 2.3 එක් එක් සාමාජික රට විසින් II අදියර යටතේ පවත්වාගෙන යන සංවේදී ලැයිස්තුව සහ III අදියර යටතේ අඩු කිරීමට එකඟ වූ ප්‍රතිශත**

| සාමාජික රට | මූලික සංවේදී ලැයිස්තුවෙහි ඇති නිෂ්පාදන ගණන | සංශෝධිත සංවේදී ලැයිස්තුවෙහි ඇති නිෂ්පාදන ගණන (අදියර – II) | III අදියර යටතේ අඩු කිරීමට එකඟ වූ ප්‍රතිශතය |
|---|---|---|---|
| (1) | (2) | (3) | (4) |
| ඇෆ්ගනිස්ථානය | 1072 | 850 | 20% |
| බංගලාදේශය | 1233 (ඌන සංවර්ධිත රටවල්)<br>1241 (ඌන සංවර්ධිත නොවන රටවල්) | 987 (ඌන සංවර්ධිත රටවල්)<br>993 (ඌන සංවර්ධිත නොවන රටවල්) | 20% |
| භූතානය | 150 | 156 | අදාළ නොවේ |
| ඉන්දියාව | 480 (ඌන සංවර්ධිත | 25 (ඌන සංවර්ධිත | 20% ඌන සංවර්ධිත |

| | | | |
|---|---|---|---|
| | රටවල්)<br>868 (ඌන සංවර්ධිත නොවන රටවල්) | රටවල්)<br>614 (ඌන සංවර්ධිත නොවන රටවල්) | රටවල් සඳහා පමණි |
| මාලදිවයින | 681 | 154 | අදාළ නොවේ |
| නේපාලය | 1257 (ඌන සංවර්ධිත රටවල්)<br>1295 (ඌන සංවර්ධිත නොවන රටවල්) | 998 (ඌන සංවර්ධිත රටවල්)<br>1036 (ඌන සංවර්ධිත නොවන රටවල්) | 20% |
| පකිස්ථානය | 1169 | 936 | 20% |
| ශ්‍රී ලංකාව | 1042 | 837 (ඌන සංවර්ධිත රටවල්)<br>963 (ඌන සංවර්ධිත නොවන රටවල්) | 10% |

***මූලාශ්‍රය: දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම් ලේකම් කාර්යාලය***

2015 හා 2016 වසර වලදී දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වෙළඳ දත්ත 2.4 වගුව මගින් දැක්වේ.

**වගුව 2.4 දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව වෙනුවෙන් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2015 / 2016**

| 2015 | | 2016 | |
|---|---|---|---|
| ආනයන | අපනයන | ආනයන | අපනයන |
| වටිනාකම (රු. මි.) | වටිනාකම (රු. මි.) | වටිනාකම (රු. මි.) | වටිනාකම (රු. මි.) |
| 696 | 3,270 | 908 | 1,270 |

***මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2015/2016***

### 2.1.1.4 ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)

1975 දී අත්සන් කරනු ලැබූ පෙරදී බැංකොක් ගිවිසුම ලෙස හඳුන්වන ලද ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම බංගලාදේශය, චීනය, ඉන්දියාව, ලාඕසය, කොරියානු ජනරජය හා ශ්‍රී ලංකාව යන සාමාජික රටවල් 6 කින් යුත් ආසියාවේ පැරණිම රටවල් කිහිපයකින් යුත් වරණීය වෙළඳ ගිවිසුම් වලින් එකකි.

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම ශ්‍රී ලංකාවට වාසිදායක ප්‍රතිඵල ලබාදෙන ක්‍රියාකාරී රටවල් කිහිපයකින් යුත් ගිවිසුමකි. චීනය හා කොරියානු ජනරජය සමඟ වෙළඳ ගිවිසුමක් යටතේ වෙළඳාම් කිරීමට පහසුකම් මෙමගින් සපයා ඇති බැවින් මෙය ශ්‍රී ලංකාවට ඉතා වැදගත් වේ.

කොහු නිෂ්පාදන, තේ, ස්වභාවික රබර්, ඇඟළුම්, මත්ස්‍ය නිෂ්පාදන, ක්‍රියාකාරී කාබන්, දැව ගෘහභාණ්ඩ, රිදී ආභරණ හා පිඟන් භාණ්ඩ ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ අපනයනය කරන ප්‍රධාන භාණ්ඩ වේ.

2007 ඔක්තෝබර් 26 දින ඉන්දියාවේ ගෝවේදී පැවති ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ අමාත්‍ය මණ්ඩල කවුන්සිලයේ දෙවන සැසියේදී ආරම්භ කරනු ලැබූ 4 වන වටයේ වෙළඳ සාකච්ඡාවල දී එලඹෙන ලද අවසන් තීරණ මගින් ශ්‍රී ලංකාව තවදුරටත් සහන බලාපොරොත්තු වේ. අමාත්‍යවරුන් විසින් මෙම නව සාකච්ඡා වටය ආරම්භ කරන ලද්දේ භාණ්ඩ ආවරණය පුළුල්කිරීම හා තීරුබදු නිදහස් කිරීම වැඩි කිරීම හා තීරුබදු නොවන ක්‍රියාමාර්ග, වෙළඳ පහසුකම් සැලසීම, සේවා සහ ආයෝජන වැනි වෙනත් ක්ෂේත්‍ර පිළිබඳව සාකච්ඡා පුළුල් කිරීම සඳහා ආදර්ශ හඳුන්වා දීම අරමුණු කරගෙනය. මෙහි තෙවන අමාත්‍ය මණ්ඩල කවුන්සිල රැස්වීම 2009 දෙසැම්බර් 15 වන දින කොරියාවේ සෝල් නුවරදී පවත්වනු ලැබීය. ඊට අමතරව වෙළඳ පහසුකම් සැලසීම හා ප්‍රවර්ධනය, ආයෝජන ආරක්ෂාව හා නිදහස් කිරීම පිළිබඳ ගිවිසුම් (framework agreements) දෙකක් සඳහා දැනටමත් අත්සන් තබා ඇත.

2016 අගෝස්තු 26 දින පවත්වනු ලැබූ ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ අමාත්‍ය කවුන්සිලයේ 49 වන සැසිවාරයේදී,

i. මොංගෝලියාව ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමහි නව සාමාජික රටක් ලෙස පිලිගැනීමේ පූර්විකාව
ii. හතරවන වටයේ සහන ඇතුලත් කරමින් ජාතික සහන ලැයිස්තු සංශෝධනය කිරීම
iii. ප්‍රභව ස්ථාන නීති

යන කරුණු ඇතුලත් කිරීම සඳහා ස්ථාවර කමිටුව යෝජනා කරනු ලැබූ පරිදි ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ මුල් ගිවිසුම සඳහා වූ දෙවන සංශෝධනය සම්බන්ධයෙන් සමාලෝචනය කරන ලෙස අමාත්‍යවරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබීය.

රටවල් කිහිපයකින් යුතු වෙළඳ ගිවිසුමක් වන ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමහි අභිමතාර්ථයන් ඉටුකරගැනීම සඳහා කලාපීය වෙනත් ප්‍රධාන රටවල් කිහිපයකින් යුතු වෙළඳ ගිවිසුම් සමග කටයුතු කිරීම අවශ්‍යය. ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ ලේකම් කාර්යාලය හා ස්ථාවර කමිටුව යන දෙකම මගින් ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම විස්තීර්ණ කලාපීය වෙළඳ ගිවිසුමක් බවට පත්කිරීමේ හදිසි අවශ්‍යතාව හඳුනාගෙන ඇත.

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ අවසන් ප්‍රතිලාභ ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ සහභාගිත්ව රටවල අපනයනකරුවන් හා ආනයනකරුවන් වෙත ලැබෙන බැවින්, එහි 45 වන ස්ථාවර කමිටුවේදී යෝජනා කරනු ලැබූ ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය පිහිටුවීම ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ ස්ථාවර කමිටුව මගින් නිර්දේශ කර ඇත. මෙම සියළු කමිටු යෝජනා අමාත්‍ය කවුන්සිලයේ හතරවන සැසියේදී අනුමත කරගැනීමට අවශ්‍ය වේ.

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ තෙවන සාකච්ඡා වටයේදී එකඟ වී ඇති පරිදි සාමාජික රටවල් මගින් ලබා දෙනු ලැබූ සහන ලැයිස්තුව (සම්පූර්ණ තීරුබදු) පහත වගුවේ දැක්වේ.

**වගුව 2.5 තෙවන වටයේ සාකච්ඡා වලදී ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ සාමාජික රටවල් විසින් ලබා දුන් පොදු සහ විශේෂ සහන**

| සාමාජික රට | පොදු සහන | විශේෂ සහන |
|---|---|---|
| බංගලාදේශය | 209 | - |
| චීනය | 1697 | 161 |
| ඉන්දියාව | 570 | 48 |
| ලාඕසය | - | - |
| කොරියානු ජනරජය | 1367 | 306 |
| ශ්‍රී ලංකාව | 427 | 72 |

*මූලාශ්‍රය: ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම් ලේකම් කාර්යාලය*

2017 ජනවාරි මාසයේදී තායිලන්තයේ පැවති ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ අමාත්‍ය කවුන්සිලයේ හතරවන රැස්වීමේදී එකඟ වූ පරිදි ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ තීරුබදු නිදහස් කිරීමේ වැඩසටහනෙහි 4 වන වටය යටතේ සංයෝජිත වර්ගීකරණ අයිතම 143 ක් සඳහා (ඉලක්කම් 08) ආන්තික වරණීය අනුපාත ලබාදීමට ශ්‍රී ලංකාව එකඟ වී ඇත. යෝජිත බදු සහන 2017 ජූලි 01 දින සිට බලපැවැත්වීමට ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ සියළු සාමාජික රටවල් එකඟ වී ඇත. ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව වෙනුවෙන් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම පිළිබඳ සාරාංශයක් 2.6 වගුව මගින් දක්වා ඇත.

වගුව 2.6 ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව වෙනුවෙන් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2015 / 2016

| 2015 | | 2016 | |
|---|---|---|---|
| ආනයන | අපනයන | ආනයන | අපනයන |
| වටිනාකම (රු. මි.) | වටිනාකම (රු. මි.) | වටිනාකම (රු. මි.) | වටිනාකම (රු. මි.) |
| 2,103 | 17,522 | 2,328 | 19,189 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2015/2016*

### 2.1.1.5 බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහු ආංශික නිදහස් වෙළඳ ගිවිසුම (BIMSTEC)

1997 ජූනි 6 වන දින බැංකොක් නගරයේදී ඇතිකරනු ලැබූ නව උප - බහු ආංශික කණ්ඩායම BIST-EC (බංගලාදේශය, ඉන්දියාව, ශ්‍රී ලංකාව හා තායිලන්ත ආර්ථික සහයෝගීතාවය) ලෙස නම්කරනු ලැබීය. මෙම රැස්වීමේදී නිරීක්ෂකයෙකු ලෙස සහභාගිවූ මියන්මාරය 1997 දෙසැම්බර් 22 වන දින බැංකොක්හි පැවති විශේෂ අමාත්‍ය රැස්වීමේදී පූර්ණ සාමාජිකයෙකු ලෙස සංවිධානයට එක්වීමත් සමඟ එහි නම බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහු ආංශික ගිවිසුම (BIMSTEC)ලෙස වෙනස් විය. 1998 දෙසැම්බර් මාසයේදී ඩකා නුවර පැවති දෙවන අමාත්‍ය රැස්වීමේදී නේපාලයට නිරීක්ෂණ තත්වය ලබාදෙන ලදි. පසුව නේපාලය හා භූතානය සඳහා පූර්ණ සාමාජිකත්වය 2004 පෙබරවාරි මාසයේදී ලබාදෙනු ලැබීය.

2004 ජූලි 31 වන දින පැවති බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහු ආංශික ගිවිසුමේ පළමු සමුළුවේදී මෙම රටවල් කණ්ඩායමේ නම බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහු ආංශික නිදහස් වෙළඳ ගිවිසුම බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහු ආංශික ගිවිසුමේ ලෙස නම්කල යුතු බවට එකඟ විය.

බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහු ආංශික ගිවිසුමෙහි ප්‍රධාන අරමුණ වන්නේ බෙංගාල බොක්ක වෙරළ තීරය දිගට ඇති දකුණු ආසියානු හා ඊසානදිග ආසියානු රටවල් අතර තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමයි. එයට වාණිජ කටයුතු, ආයෝජන, තාක්ෂණ, සංචාරක, මානව සම්පත් සංවර්ධනය, කෘෂිකර්මය, ධීවර, ප්‍රවාහන හා විදුලි සංදේශ, රෙදිපිළි හා සම්භාණ්ඩ ආදිය ඇතුලත්ය.

බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහු ආංශික ගිවිසුමේ වෙළඳ කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීමේ කමිටුවේ විසිවන රැස්වීම 2015 සැප්තැම්බර් 07-09 දිනයන්හිදී තායිලන්තයේදී පැවැත්වුණි. 2011 පෙබරවාරි 21-23 දිනයන්හි පැවති 19 වන රැස්වීමේදී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය එහිදී පෙන්වාදෙනු ලැබීය. ක්‍රියාකාරී කණ්ඩායම මගින් ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව පිළිබඳ ගැටළු සංශෝධනය කිරීම හා සියලුම සාමාජික රටවලට පොදු වූ තීරුබදු ගාස්තු අඩුකිරීම අරමුණ කරගත් සංශෝධිත ගිවිසුම සඳහා කෙටුම්පත් කරන ලද ප්‍රඥප්තිය සමාලෝචනය කරනු ලැබීය. ඒ අනුව, තීරුබදු නිදහස් කිරීම සඳහා එකඟ වූ පරිදි භාණ්ඩ වෙළඳාම පිළිබඳ ගිවිසුම බලාත්මක කිරීමේ දිනය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට කමිටුව එකඟ විය.

වගුව **2.7** ගිවිසුම් ගත වූ විගස තීරු බදු ලිහිල් කිරීම

| අනු පිළිවෙල | *රටවල්* | *ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ තායිලන්තය සඳහා* | *බංගලාදේශය, භූතානය, මියන්මාරය සහ නේපාලය සඳහා* |
|---|---|---|---|
| 1 | ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ තායිලන්තය | 2016 ජුලි 01 සිට 2019 ජුනි 30 | 2016 ජුලි 01 සිට 2017 ජුනි 30 |
| 2 | බංගලාදේශය, භූතානය, මියන්මාරය සහ නේපාලය | 2012 ජුලි 01 සිට 2021 ජුනි 30 | 2012 ජුලි 01 සිට 2019 ජුනි 30 |

*මූලාශ්‍රය: බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ සහ ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුආංශික නිදහස් වෙළඳ ගිවිසුම් ලේකම් කාර්යාලය*

වගුව **2.8** සාමාන්‍ය පරිදි තීරු බදු ලිහිල් කිරීම

| අනු පිළිවෙල | රටවල් | ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ තායිලන්තය සඳහා | බංගලාදේශය, භූතානය, මියන්මාරය සහ නේපාලය සඳහා |
|---|---|---|---|
| 1 | ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ තායිලන්තය | 2017 ජුලි 01 සිට 2022 ජුනි 30 | 2017 ජුලි 01 සිට 2020 ජුනි 30 |
| 2 | බංගලාදේශය, භූතානය, මියන්මාරය සහ නේපාලය | 2017 ජුලි 01 සිට 2022 ජුනි 30 | 2017 ජුලි 01 සිට 2025 ජුනි 30 |

*මූලාශ්‍රය: බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ සහ ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුආංශික නිදහස් වෙළඳ ගිවිසුම් ලේකම් කාර්යාලය*

ශ්‍රී ලංකාව විසින් බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහු ආංශික ගිවිසුමේ සාමාජික රටවල් විසින් සිදු කරන ලද බැඳීම්වලට අනුකූලව තීරුබදු නිදහස් කිරීමේ වැඩසටහන සම්පූර්ණ කර ඇති අතර බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහු ආංශික ගිවිසුම බලාත්මක වූ විට එය ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම්ව සිටී.

**වගුව 2.9 බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ සහ ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුආංශික නිදහස් වෙළඳ ගිවිසුම සඳහා බදු නිදහස් කරන උප ලේඛනය**

| අනු පිළිවෙල | ආකෘතිය / ක්‍රමවේදය | තීරු බදු සංකේතාංක ප්‍රතිශතය (සංයෝජිත වර්ගීකරණය 2007 - ඉලක්කම් 6) |
|---|---|---|
| 1 | ගිවිසුම් ගත විගස තීරු බදු ඉවත් කිරීම | 10% |
| 2 | සාමාන්‍ය පරිදි තීරු බදු ඉවත් කිරීම | 48% |
| 3 | සාමාන්‍ය පරිදි තීරු බදු අඩු කිරීම | 19% |
| 4 | සංවේදී ලැයිස්තුව | 23% |

*මූලාශ්‍රය: බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ සහ ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුආංශික නිදහස් වෙළඳ ගිවිසුම් ලේකම් කාර්යාලය*

සංයෝජිත වර්ගීකරන අනුවාද 2007 යටතේ සිදු කිරීමට යෝජිත එකගතා උපලේඛනය සංයෝජිත වර්ගීකරන අනුවාද 2007 පරිවර්තනය යටතේ ඉලක්කම් 06කින් යුක්තව සිදු කිරීමට තීරණය විය. කෙසේ වුවද, සමහර සාමාජික රටවල් අභ්‍යන්තර ක්‍රමවේදයන් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ගිවිසුම ක්‍රියාත්මක කිරීම සිදු නොවීය. බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහු ආංශික ගිවිසුමේ සාමාජික රටවල් විසින් තීරුබදු නිදහස් කිරීමේ වැඩසටහන සංයෝජිත වර්ගීකරණ 2017

අනුවාදය අනුව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනාවක් ඉදිරිපත්කර ඇති අතර, බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහු ආංශික ගිවිසුමේ ලේකම් කාර්යාලය මගින් 2017 වසරේදී එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ඇත.

### 2.1.1.6 යෝජිත චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

2014 මාර්තු මාසයේදී චීනය හා ශ්‍රී ලංකාව ඒකාබද්ධව සිදුකරන ලද ශක්‍යතා අධ්‍යයනයේ ප්‍රතිඵල මත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමක් ඇති කිරීම මගින් දෙරට අතර ද්විපාර්ශික ආර්ථික හා වෙළඳ සබඳතා හා ප්‍රතිලාභ වැඩි කිරීමට එය දායක වන බවයි.

චීනය, ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම වෙළඳ පාර්ශවකරු වෙමින්, 2016 වර්ෂය තුළදී ශ්‍රී ලංකාවේ මුලු ආනයනවලින් 20%ක ප්‍රමාණයකට දායක වූ රට බවට පත්ව ඇත. ශ්‍රී ලංකාවේ අපනයන වෙළඳපල සඳහා 2.9% ක පමණ අඩු දායකත්වයක් චීනය සැපයුවද, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා ඉහළ විභවතාවයන් පවතී. ඒ අනුව, ශ්‍රී ලංකාවෙන් චීනය වෙත කෙරෙන අපනයනයන්ගේ සීඝ්‍ර වර්ධනය නිසා වෙනත් රටවලට වඩා චීනය ශ්‍රී ලංකාවේ වඩා වැදගත් වර්ධනය වන අපනයන වෙළඳපල බවට පත්ව ඇත. එනම්, නිදහස් වෙළඳ ගිවිසුම් අත්සන් කිරීමත් සමඟ මෙරටට චීනය නැගී එන අපනයන වෙළඳපලක් වනු ඇත.

චීනය සමඟ වන නිදහස් වෙළඳ ගිවිසුම 2017 වසරේදී අවසන් කිරීමට බලාපොරොත්තු වේ. එසේම, 2016 අවසානය වන චීනය සමග වෙළඳ ගිවිසුමට සම්බන්ධ සාකච්ඡා වට හතරක් පවත්වා ඇත.

| සාකච්ඡා වටය | දිනය සහ ස්ථානය | සාකච්ඡා කරන ලද මාතෘකා |
|---|---|---|
| පළමු සාකච්ඡා වටය | 2013 සැප්තැම්බර් 17-19<br>කොළඹ | • ක්‍රියාකාරී ක්‍රමවේදය<br>• පරාසයන්<br>• ප්‍රවර්ධන අංග<br>• ඉදිරි මග සැලැස්ම හා ලැයිස්තු<br>• භාණ්ඩ වෙළඳාම සඳහා වූ බදු අඩු කිරීමේ ක්‍රමවේදයන් |
| දෙවන සාකච්ඡා වටය | 2014 නොවැම්බර් 26 - 28<br>බීජිං | • භාණ්ඩ වෙළඳාම<br>• සේවා වෙළඳාම<br>• ආයෝජන<br>• ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාවය<br>• ප්‍රභව ස්ථාන නීති<br>• රේගු ක්‍රමවේදය සහ වෙළඳාම පහසුකරණය<br>• තාක්ෂණික බාධක<br>• සනීපාරක්ෂක හා ස්වස්ථතා (මිනුම්)<br>• වෙළඳ ගැටළු සඳහා ප්‍රතිකර්ම<br>• ආරවුල් නිරාකරණය |
| තෙවන සාකච්ඡා වටය | 2015 අගෝස්තු 02 - 04<br>කොළඹ | • නැව් බඩු වෙළඳාම<br>• සේවා වෙළඳාම<br>• ආයෝජන<br>• ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාවය<br>• නිෂ්පාදනයේ ප්‍රභව ස්ථාන නීති<br>• රේගු නියෝග හා වෙළඳාමෙහි ගැලපීම<br>• සනීපාරක්ෂක හා ස්වස්ථතා සහ වෙළඳාම සම්බන්ධ තාක්ෂණික බාධා<br>• වෙළඳාම, නීති ආදිය අනාවරණය |
| සිව්වන සාකච්ඡා වටය | 2016 නොවැම්බර් 21 - 23<br>බීජිං | • භාණ්ඩ වෙළඳාම සම්බන්ධ ගැටළු<br>• සේවා වෙළඳාම<br>• ආයෝජන |

| | | |
|---|---|---|
| | | • ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාවය<br>• ප්‍රභව ස්ථාන නීති<br>• රේගු ක්‍රමවේදය<br>• වෙළඳාම පහසුකරණය<br>• වෙළඳාම සම්බන්ධ තාක්ෂණික බාධා<br>• සනීපාරක්ෂක හා ස්වස්ථතා මිනුම්<br>• වෙළඳ ගැටළු සඳහා ප්‍රතිකර්ම<br>• ආරවුල් නිරාකරණය |

### 2.1.1.7 යෝජිත සිංගප්පූරු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

2016 අවසානය වන විට සිංගප්පූරුව සමඟ නිදහස් වෙළඳ ගිවිසුම සාකච්ඡා වට තුනක් සම්පූර්ණ කරනු ලැබීය. ඒ අනුව මෙම යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම මගින් භාණ්ඩ වෙළඳාම, සේවා අලෙවිය, ආයෝජන, විදුලි සංදේශ හා විද්‍යුත් වාණිජ කටයුතු (E-Commerce), මූල්‍ය සේවා, බුද්ධිමය දේපළ, තරගකාරිත්වය හා විනිවිදභාවය, සනීපාරක්ෂක හා ස්වස්ථතා සහ වෙළඳාම සම්බන්ධ තාක්ෂණික බාධා, රේගු කටයුතු හා වෙළඳාම පහසුකරණය ආදී කරුණු ආවරණය වන විස්තීර්ණ ස්වභාවයේ වෙළඳ ගිවිසුමක් වේ. මෙම සිංගප්පූරුව සමඟ යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම 2019 වර්ෂය අවසාන වන විට අවසන් කිරීමට යෝජනා වී ඇත.

### 2.1.1.8 යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA)

යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම සම්බන්ධ දෙවන සාකච්ඡා වටය 2016 දී පවත්වනු ලැබීය. මෙම සාකච්ඡාවලදී ගිවිසුමේ විෂය පථය මෙන්ම ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද පිළිබඳව ද සාකච්ඡා කෙරිණි. යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම යටතේ භාණ්ඩ වෙළඳාම, සේවා වෙළඳාම , ආයෝජන, තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය හා රේගු කටයුතු හා වෙළඳාම පහසුකරණය යන ක්ෂේත්‍රයන් ආවරණය කෙරේ. යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම සම්බන්ධ සාකච්ඡා 2017 වර්ෂය අවසාන වන විට නිම කිරීමට යෝජිතය.

## 2.2 නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අන්තර්ජාතික වෙළඳාම

2016 වසරේදී ශ්‍රී ලංකාව විසින් වෙළඳ ගිවිසුම් යටතේ කරනු ලැබූ වෙළඳ කටයුතු පිළිබඳ විස්තර 2.10 වගුව මගින් දක්වා ඇත.

**වගුව 2.10 - 2016 වර්ෂය තුළ ශ්‍රී ලංකාව විසින් වෙළඳ ගිවිසුම් යටතේ කරන ලද ආනයන සහ අපනයන**

| අනු පිළිවෙල | වෙළඳ ගිවිසුම | ආනයන වටිනාකම (රු. මි) | අපනයන වටිනාකම (රු. මි) |
|---|---|---|---|
| 1 | ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) | 27,216 | 57,576 |
| 2 | පකිස්තාන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) | 3,069 | 9,123 |
| 3 | දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) | 972 | 1,759 |
| 4 | ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) | 2,328 | 19,189 |
| එකතුව | | **33,585** | **87,647** |

***මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2016***

## 2.3 වෙළඳාම් පහසුකරණය

ව්‍යාපාර කටයුතුවලදී පෞද්ගලික අංශය මුහුණපාන ගැටළුවලට විසඳුම් ලබාදීමේ වේදිකාවක් සැපයීම සඳහා මුදල් අමාත්‍යාංශය මගින් 2015 මැයි මාසයේ දී ව්‍යාපාර පහසු කිරීමේ ඒකකය (EODBU) ස්ථාපනය කර තිබේ. මෙම ඒකකය මගින් 2015 වසරේ සිට සෑම මාස 2 කට වරක්ම ව්‍යාපාර පහසුකිරීමේ සංසද සංවිධානය කර ඇත. ගැටළු ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපාර පහසු කිරීමේ ඒකකය මගින් වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වා ගෙන යනු ලැබේ. 2016 අවසානය වන විට මෙම ඒකකය මගින් සංසද 10 ක් පවත්වා ඇත.

මෙම වෙබ් අඩවියට යොමු කරන ගැටළු ව්‍යාපාර පහසු කිරීමේ ඒකකය මගින් හඳුනාගෙන විශේෂයෙන්ම වෙළඳ කටයුතු හා තීරුබදු සම්බන්ධ ගැටළු විසඳීම සඳහා මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලැබේ. ක්‍රමෝපාය මට්ටමේ තීරණ, පනත් සංශෝධන, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම, ගැසට් නිවේදන නිකුත් කිරීම ආදී ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ ගැටළු විසඳීම සඳහා ද දෙපාර්තමේන්තුව සම්බන්ධ වී තිබේ.

වඩා යහපත් ව්‍යාපාරික පරිසරයක් සඳහා ආධාරවීම, පෞද්ගලික අංශයේ වර්ධනය හා ගෝලීය වෙළඳපලෙහි ඔවුන්ගේ තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා රටේ උපායමාර්ගික පිහිටීම යොදාගැනීම හා වෙළඳාම සඳහා සහාය දැක්වීමට සරල වූ පුළුල් කළමනාකරණ ක්‍රියාමාර්ග යොදා ගැනීම තුළින් ජාත්‍යන්තර ඍජු ආයෝජන ආකර්ශනය කරගැනීම සඳහා වෙළඳ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාව ශ්‍රී ලංකා රජය හඳුනාගෙන තිබේ.

රේගු ක්‍රියාමාර්ග ක්‍රමවත්කිරීම, අනුකූල කිරීම හා නවීකරණය කිරීම අරමුණු කරගත් ලෝක වෙළඳ සංවිධානය, වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුම කෙටි කලක් තුලදී බලාත්මක වනු ඇත. සංක්‍රමණය වෙමින් පවත්නා භාණ්ඩ ද ඇතුලත්ව භාණ්ඩ සංචලනය, මුදාහැරීම හා නිශ්කාශනය කඩිනම්කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන එයට ඇතුලත්ය. වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ යෙදී සිටින ආයතන අතර ඵලදායී සහයෝගීතාවය සඳහා වන මිනුම් ද එහි දක්වා ඇත.

රැකියා උත්පාදනය හා බලාපොරොත්තු වන ආර්ථික සංවර්ධනය ළඟාකර ගැනීම අරමුණු කරගෙන වෙළඳාම වැඩිදියුණු කිරීම හා ජාත්‍යන්තර වෙළඳපලේ දායකත්වය වැඩි කිරීම සඳහා වන වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුමට අනුකූලව වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම සඳහා රජය ප්‍රමුඛතාවය ලබාදී ඇත. ඒ අනුව, 2016 දී ශ්‍රී ලංකාවේ ජාතික වෙළඳ පහසුකරණ කමිටුව (NTFC) ස්ථාපිත කරන ලදී.

රාජ්‍ය හා පෞද්ගලික අංශය නියෝජනය කරන සාමාජිකයන් 17 දෙනෙකුගෙන් සමන්විත ලංකාවේ ජාතික වෙළඳ පහසුකරණ කමිටුවෙහි සම සභාපතිත්වය ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා හා වාණිජ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දරනු ලැබේ. වෙළඳ පහසුකරණ ඒජන්සිය හා ශ්‍රී ලංකාවේ ඇති වෙනත් ඕනෑම වෙළඳාම සඳහා පහසුකම් සලසන ක්‍රියාදාමයන් ඵලදායී ලෙස සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ජාතික වෙළඳ පහසුකරණ කමිටුවට සහය වීමට ලේකම් කාර්යාලයක් ස්ථාපනය කර ඇත. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව ජාතික වෙළඳ පහසුකරණ කමිටුවෙහිදී මුදල් අමාත්‍යාංශය නියෝජනය කරනු ලැබේ.

ශ්‍රී ලංකාව ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ පහසුකරණ ඒජන්සිය යටතේ වූ, A, B, C යන කාණ්ඩ අනුව එහි ක්‍රියාත්මක කිරීමේ උපලේඛනය නිමකර දැනටමත් ලෝක වෙළඳ සංවිධානය වෙත භාරදී ඇත. A, B හා C යටතේ පිළිවෙළින් 15, 03 හා 23 වූ බැඳීම් 2017 වර්ෂයේ මුල් භාගයේදී බලාත්මක වන ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ පහසුකරණ ඒජන්සිය යටතේ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව බලාපොරොත්තු වන අතර, ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුමේ B හා C කාණ්ඩ යටතේ ඇති බැඳීම් ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ හා ලෝක බැංකුවේ තාක්ෂණික සහයෝගය ලබාගැනීමට ඇති අවස්ථාවන් පිළිබඳවද සොයා බැලීමට ශ්‍රී ලංකාව කටයුතු කරමින් සිටී.

## 2.4 ආනයන තීරුබදු ව්‍යුහය

සාමාන්‍යයෙන් සංයෝජිත වර්ගීකරණ පද්ධතිය ලෙස හැඳින්වෙන "සංයෝජිත වෙළඳ භාණ්ඩ විස්තර කිරීම හා සංකේතාංක පද්ධතිය" රේගු තීරුබදු නාමකරණය හා වර්ගීකරණය, ආනයන හා අපනයන භාණ්ඩ මත රේගු බදු වෙනත් අයබදු අයකිරීම හා භාණ්ඩ හඳුනාගැනීම සඳහා යොදා ගැනේ. ආනයන හා අපනයන වෙළඳාමේ සම්බන්ධ සංඛ්‍යාලේඛන රැස්කර ගැනීම සඳහා ද එය ප්‍රයෝජනවත්වේ. ශ්‍රී ලංකාව ඉලක්කම් 08 කින් සමන්විත සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යොදා ගන්නා අතර එහි අවසාන ඉලක්කම් දෙක ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සඳහා නිර්මාණය කරන ලද ජාතික උප බෙදුම් වේ.

1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ පනත හා සංශෝධිත රේගු ආඥාපනත, (235 වන අධිකාරය) විශේෂ වෙළඳභාණ්ඩ පනත, වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු පනත හා අපනයන සංවර්ධන මණ්ඩල පනත හා 1989 අංක 13 දරණ නිෂපාදන බදු (විශේෂ විධි විධාන) පනත යටතේ ඇති නෛතික ප්‍රතිපාදන යටතේ වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක වේ.

විවිධ පාර්ශවකරුවන් කෙරෙහි ඇතිවන බලපෑම සැළකිල්ලට ගෙන 2016 දී විවිධ අයිතම සඳහා විවිධ බදු අනුපාතයන් පනවනු ලැබීය. භාණ්ඩ කිහිපයක් හැර සාමාන්‍යයෙන් දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා අඩක් නිම කළ ද්‍රව්‍ය සඳහා ශුන්‍ය හෝ අඩු බදු අනුපාතද නිමි භාණ්ඩ සඳහා ඉහළ බදු අනුපාත ද පනවනු ලැබේ. ශ්‍රී ලංකාව විසින් 0%, 15% හා 30% ලෙස වූ තීරු බදු කාණ්ඩ තුනක් ඇතුළත් බදු ව්‍යුහයක් වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් 2016 වසරේදී හඳුන්වා දුන් අතර මෙම අනුපාතයන්ට වෙනස් වූ සුළු බදු ප්‍රතිශතයන් ප්‍රමාණයක්ද ඊට හඳුන්වා දී ඇත. 2016 වර්ෂය අවසාන වන විට එක් එක් තීරු බදු ප්‍රතිශතයන් යටතේ වූ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ප්‍රමාණය 2.11 වගුව මගින් පෙන්වා දී ඇත.

**වගුව 2.11 - 2016 දෙසැම්බර් 31 දිනට තීරුබදු ව්‍යුහය**

| අනු පිළිවෙල | තීරු බදු අනුපාතය | තීරුබදු කාණ්ඩ සංඛ්‍යාව (සංයොජිත වර්ගීකරණ 2012 : ඉලක්කම් 8) | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1 | නිදහස් | 3,938 | 55.92 |
| 2 | 5% | 2 | 0.03 |
| 3 | 10% | 9 | 0.13 |
| 4 | 15% | 1,309 | 18.59 |
| 5 | 25% | 25 | 0.36 |
| 6 | 30% | 1,430 | 20.31 |
| 7 | 75% | 03 | 0.04 |
| 8 | 85% | 01 | 0.01 |
| 8 | 125% | 05 | 0.07 |
| 9 | නිශ්චිත | 65 | 0.92 |
| 10 | නිශ්චිත හා වටිනාකම මත | 255 | 3.62 |
| එකතුව | | **7,042** | **100.00** |

*මූලාශ්‍රය: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016*

වගුව **2.12 - 2009 සිට 2016 දක්වා තීරුබදු ව්‍යුහය තුළ සිදු කරන ලද වෙනස්කම්**

| අනු පිළිවෙල | තීරුබදු කාණ්ඩය | තීරුබදු සංකේතාංක ප්‍රමාණයන් (අංක 8කින් යුතු) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | **2016** | **2015** | **2014** | **2013** | **2012** | **2011** | **2010** | **2009** |
| 1 | නිදහස් | 3,938 | 3,922 | 3,410 | 3,379 | 3,024 | 3,024 | 2,967 | 764 |
| 2 | 2.5% | | | | | | | | 2,087 |
| 3 | 5% | 2 | | | | 410 | 412 | 415 | |
| 4 | 6% | | | | | | | | 475 |
| 5 | 7.5% | | | 188 | 184 | | | | |
| 6 | 10% | 9 | | | | | | | |
| 7 | 15% | 1,309 | 1,324 | 1,601 | 1,590 | 1,587 | 1,508 | 1,516 | 1,541 |
| 8 | 25% | 25 | | 1,450 | 1,415 | | | | |
| 9 | 28% | | | | | | | | 1,382 |
| 10 | 30% | 1,430 | 1,457 | | | 1,504 | 1,323 | 1,327 | |
| 11 | සුඛෝපභෝගී අනුපාත | 9 | 9 | 9 | 9 | 9 | 9 | 9 | 9 |
| 12 | විශේෂිත/ ඒකක අනුපාත | 65 | 67 | 84 | 84 | 84 | 77 | 60 | 52 |
| 13 | විශේෂිත හෝ වටිනාකම මත | 255 | 186 | 184 | 183 | 200 | 162 | 193 | 210 |
| **එකතුව** | | **7,042** | **6,965** | **6,926** | **6,844** | **6,818** | **6,515** | **6,487** | **6,520** |

***මූලාශ්‍රය: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016***

### *2*.4.1 සංයෝජිත වර්ගීකරණය සඳහා 2016 දී ඇතුලත් කරන ලද උප ඒකක

2016 දී සංයෝජිත වර්ගීකරණ යටතේ නිර්මාණය කරන ලද සංයෝජිත වර්ගීකරණ ජාතික උප බෙදුම් ඇමුණුමෙහි 1 හි 4.1 වගුව මගින් සාරාංශ කර දක්වා ඇත. ඒ අනුව 2016 දී වෙළඳාම, ආයෝජන හා කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම සඳහා ඇතිකරනු ලැබූ මුළු ජාතික උප බෙදුම් (NSD) සංඛ්‍යාව 131 කි. එසේම, එම නිර්මාණයේදී ජාතික උප බෙදුම් 52 ක් ද ඉවත්කරනු ලැබීය.

### 2.4.2 - 1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ පනත යටතේ සිදුකරන ලද සංශෝධනයන්

1962 අංක 19 දරණ පනත (රේගු ආනයන බදු) යටතේ පළකරනු ලැබූ ආදායම් **සංරක්ෂණ** ආඥාව පිළිබඳ විස්තර ඇමුණුමෙහි ඇති 4.2 වගුවේ දැක්වේ. වෙළඳ කටයුතු හා කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම පිණිස 2016 වසරේදී ආදායම් ආරක්ෂණ පනත යටතේ නියෝග 07 ක් නිකුත් කරනු ලැබීය. එසේම, රේගු ආඥා පනතේ (235 අධිකාරිය) 101 වැනි වගන්තිය යටතේ පනවන ලද රෙගුලාසි 4.3 වගුවෙහි දක්වා ඇත.

### 2.4.3 2007 අංක 48 දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) පනත

2017 අංක 48 දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ වන නෛතික විධිවිධාන පදනම් කරගෙන තෝරාගත් විශේෂ භාණ්ඩ සඳහා සියලු බදු වෙනුවට තනි බද්දක් අය කර ගැනීම සඳහා වූ ගැසට් නිවේදන 2016 වර්ෂයේදිද නිකුත් කරනු ලැබිණ. අස්වැන්න නෙලන කාලවලදී දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කිරීම හා පාරිභෝගිකයා සඳහා දැරිය හැකි මිලක් පවත්වා ගැනීම සඳහා මෙම සංශෝධන සිදු කරනු ලැබේ. (උදා - අර්තාපල්, රතුලූණු හා ලොකු ලූණු) 2016 වර්ෂයේදී විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ එහි අරමුණු ඉටුකර ගැනීම සඳහා නිකුත් කරන ලද මුළු නියෝග 21 ඇමුණුමෙහි 4.4 වගුවෙහි දක්වා ඇත.

## 2.5 බදු කපාහැරීම්

රේගු ආඥා පනතේ (235 වන අධිකාරය) 19 (අ) වගන්තිය යටතේ අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරන ලද විශේෂ ව්‍යාපෘති සඳහා රේගු ආනයන බදු (Customs Import Duty) කපා හැරිය හැක. ඒ අනුව 2016 දී මාර්ග හා මහාමාර්ග, ගුවන්තොටුපල හා ගුවන් සේවා, වරාය හා ධීවර, ජල සම්පාදන හා වාරිමාර්ග, විදුලිබල, නිවාස යෝජනා ක්‍රම, රෝහල් හා විශ්වවිද්‍යාල ඉදිකිරීම යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ව්‍යාපෘති සඳහා බදු කපාහැරීම් ලබාදෙනු ලැබීය. 2016 දී කපා හරින ලද රේගු ආනයන බදු පිළිබඳ විස්තර 2.13 වගුව මගින් පහත පරිදි සාරාංශකර ඇත.

**වගුව 2.13 - 2016 වර්ෂයේදී රේගු ආඥා පනතේ 19 (අ) වගන්තිය යටතේ දී ඇති තීරුබදු සහන**

| අනු පිළිවෙල | අංශය | තීරුබදු කපා හැරීම සඳහා නිකුත් කළ බලපත්‍ර ගණන |
|---|---|---|
| 1 | ආරක්ෂක | 365 |
| 2 | අධ්‍යාපනය | 277 |
| 3 | සෞඛ්‍යය | 55 |
| 4 | යටිතල පහසුකම් | 102 |
| 5 | ජල සම්පාදන | 493 |
| 6 | වෙනත් | 837 |
| **එකතුව** | | **2,129** |

*මූලාශ්‍රය: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016*

රේගු ආඥා පනතේ 19(අ) වගන්තිය පහත පරිදි වේ. එනම්,

*(1) නියමයෙහි සඳහන් යම් තැනැත්තෙකු විසින් අපනයන කරන ලද, නැතහොත් ඔහු නමට ප්‍රේෂණය කරන ලද යම් භාණ්ඩයක් නියමයෙහි සඳහන් විය හැකි ( ඉවත් කර ගැනීමට පෙර හෝ පසුව ඔහු විසින් සපුරා ලිය යුතු) කොන්දේසිවලට යටත්ව, ඒ සඳහා අය කළ යුතු රේගු තීරු බදු සියල්ලෙන් හෝ ඉන් කොටසකින් නිදහස් කිරීම පොදු යහපත සඳහා යෝග්‍ය යයි අමාත්‍යවරයා විසින් සළකනු ලැබේ නම්, ඔහු විසින් එසේ කළ හැකිය.*

ඒ අනුව, ගරු මුදල් අමාත්‍යවරයාගේ බලතල අනුව ද මෙම දෙපාර්තමේන්තුව විසින් පොදු බදු සහන ලබා දීම සිදු කරනු ලබන අතර 2016 වර්ෂය තුළදී ලබා දුන් බදු සහන පිළිබඳ සාරාංශයක් පහත 2.14 වගුවෙහි දක්වා ඇත.

**වගුව 2.14 රේගු ආඥා පනතේ 19 (අ) වගන්තිය යටතේ පොදු තීරුබදු කපා හැරීම**

| අනු පිළිවෙල | අයිතමය | වර්තමාන රේගු ආනයන බද්ද | තීරුබදු කපා හැරීම | අයකර ගත හැකි තීරුබදු | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|---|
| 1 | ඩීසල් | ලීටරයක් සඳහා රු.15/- | ලීටරයක් සඳහා රු.06/- | ලීටරයක් සඳහා රු.09/- | 2014.12.05 සිට 2016.06.22 දක්වා |
| | | | නැත | ලීටරයක් සඳහා රු.15/- | 2016.06.23 සිට ක්‍රියාත්මක වන පරිදි තීරු බදු සහන ඉවත් කර ඇත. |
| 2 | තිරිඟු ඇට | 15% හෝ කි.ගෑම් 1කට රු. 10/- | සම්පූර්ණයෙන් කපා හරින ලද | නැත | 2015.01.30 සිට 2016.02.08 දක්වා |
| | | | කි.ගෑම් 1කට රු. 4/- | කි.ගෑම් 1කට රු. 6/- | 2016.02.09 සිට 2016.09.15 දක්වා |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 15% හෝ කි.ග්‍රෑම් 1කට රු. 12/- | නැත | 15% හෝ කි.ග්‍රෑම් 1කට රු. 12/- | 2016.09.15 |
| | | 15% හෝ කි.ග්‍රෑම් 1කට රු. 12/- | කි.ග්‍රෑම් 1කට රු. 3/- | කි.ග්‍රෑම් 1කට රු. 9/- | 2016.12.10 සිට අද දක්වා |
| 3 | කිරි පිටි | 20% හෝ කි.ග්‍රෑම් 1කට රු. 225/- | කි.ග්‍රෑම් 1කට රු. 90/- | කි.ග්‍රෑම් 1කට රු. 135/- | 2016.07.15 2016.11.10 |
| | | | කි.ග්‍රෑම් 1කට රු. 125/- | කි.ග්‍රෑම් 1කට රු. 100/- | 2016.11.11 සිට 2016.12.19 දක්වා |
| | | | කි.ග්‍රෑම් 1කට රු. 180/- | කි.ග්‍රෑම් 1කට රු. 45/- | 2016.12.20 සිට අද දක්වා |

***මූලාශ්‍රය: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016***

## 2.6 වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය

ලෝක වෙළඳ සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්තිය වසර පහකට වරක් සංශෝධනය කරනු ලබන අතර මෙම සංශෝධනය 2016 වර්ෂයේදීද සිදු කරනු ලැබීය. මෙම ප්‍රතිපත්ති සමාලෝචනයේ දී, ශ්‍රී ලංකාව විසින් ලෝක වෙළඳ සංවිධානය හා එකග වී ඇති උපරිම බදු සීමාවන් ඉක්මවා බදු පැනවීම පිළිබඳව විමසීමක් සිදු කර ඇත. ඒ අනුව, ඉහත උපරිම එකගතා බදු මට්ටම ඉක්මවා ඇති අයිතම 132ක් සඳහා වූ බදු එකගතාවයන්ට අදාළ වන පරිදි සංශෝධනය කිරීමට කටයුතු කරන ලදී.

මෙම වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනයේදී විශේෂ වෙළඳ භාණ්ඩ බදු, සෙස් බදු හා වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු ආදී අමතර ආනයන තීරුබදු පැනවීම පිළිබඳව සාකච්ඡා කරන ලදී. එහිදී, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පැනවීමේදී අනෙකුත් බදු අය නොකෙරෙන අතර දේශීය ගොවියා හට සාධාරණ මිළක් ලබා දෙනු පිණිස පනවනු ලබන බද්දක් බවට අවධාරණය කර ඇත.

තවද, අයිතම 100ක් සඳහා වූ සෙසු බදු ඉවත් කිරීමට 2016 වර්ෂයේදී ශ්‍රී ලංකාව කටයුතු කරමින් වඩාත් ක්‍රමානුකූල වූ බදු ව්‍යුහයක් හඳුන්වා දීමට කටයුතු කර ඇත.

## 2.7 ආයෝජන

### 2.7.1 විදේශ රටවල කරනු ලබන අයෝජන

විනිමය පාලන පනතේ 17(2) වගන්තිය අනුව විදේශ රටවල සිදු කරනු ලබන ආයෝජන සඳහා මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුව ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම සඳහා ඔවුන්ගේ නිර්දේශය සමඟ එවැනි ආයෝජන ඉල්ලීම් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2016 වසරේදී රටට හිතකර විදේශ සංචිත ප්‍රමාණයක් පවත්වාගෙන යමින් පාලිත තත්ත්වයක් යටතේ වුවද එවැනි බාහිර විදේශ ආයෝජන සඳහා අනුමැතින් ලබාදී ඇත. 2016 වසරේදී ආයෝජකයන් හට විදේශ ආයෝජන අවස්ථා සඳහා ලබාදුන් අනුමැතිය පිළිබඳ විස්තර 2.15 වගුවේ දක්වා ඇත.

ආයෝජකයන් විසින් මුහුණ දෙනු ලබන නොවැලැක්විය හැකි හේතූන් මත, ඔවුන් විසින් විදේශීය රටවල සිදුකර ඇති ආයෝජන ඉවත් කර ගැනීමට ඉල්ලීම් සිදු කරනු ලැබේ. එම ඉල්ලීම් සඳහා විනිමය පාලන පනතට අනුව මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. එසේ විදේශ ආයෝජන ඉවත් කර ගැනීමට සිදුකර ඇති ඉල්ලීම් සඳහා ලබා දුන් අනුමැතින් පිළිබඳ විස්තර 2.16 වගුවේ දක්වා ඇත.

වගුව 2.15 2016 වසරේදී අනුමැතිය ලබා දී ඇති විදේශීය බාහිර ආයෝජන

| අනු පිළිවෙල | ආයතනය | ආයෝජන ක්ෂේත්‍රය | ආයෝජනය වටිනාකම | රට | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|
| 1 | එල් ටී එල් හෝල්ඩිංග්ස් (පෞද්) සමාගම | බලශක්ති | ඉන්දියානු රුපියල් මිලියන. 375 | ඉන්දියාව | ආසියාටික් ඉලෙක්ට්‍රිකල් ස්විච්ජියර් පුද් සමාගමෙහි කොටස් 99.06% අත්කර ගැනීමට |
| 2 | හේලීස් පුද්ගලික සමාගම | හෝටල් කර්මාන්තය | ඇ.ඩො. මිලියන10 | මාලදිවයින | මාලදිවයිනේ ලක්සිරි රිසෝට් පුද් සමාගමේ ආයෝජනය කිරීමට |
| 3 | කොමර්ෂල් බැන්ක් පී එල් සී | බැංකු | ඇ.ඩො. මිලියන 7 | මාලදිවයින | මාලදිවයිනේ පිහිටා ඇති මාලදිවයිනේ කොමර්ෂල් බැංකුවේ කොටස් 55% අත්කර ගැනීමට. |
| 4 | බ්‍රවුන්ස් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට් සමාගම | හෝටල් කර්මාන්තය | ඇ.ඩො. මිලියන.9 | මාලදිවයින | මාලදිවයිනේ එන් පී එච් ඉන්වෙස්ට්මන්ට් පුද්ගලික සමාගමේ කොටස් 51% අත්කර ගැනීමට |
| 5 | ලංකා ඔරික්ස් ලීසිං කම්පැනි පී එල් සී | ක්ෂුද්‍ර මූල්‍ය | ඇ.ඩො. මිලියන6 | මියන්මාරය | එල් ඕ එල් සී මියෙන්මාර් මයික්‍රොෆයිනෑන්ස් සමාගමේ කොටස් අත්කර ගැනීමට. |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016*

**2.16 වගුව 2016 වසරේදී විදේශ ආයෝජන ඉවත්කර ගැනීම සඳහා ලබාදුන් අනුමැතීන්**

| අනු පිළිවෙල | ආයතනය | ආයෝජන ක්ෂේත්‍රය | රට | විස්තරය |
|---|---|---|---|---|
| 1 | ලංකා ඔරික්ස් ලීසිං කම්පැණි පී එල් සී | ශුද්‍ර මූල්‍ය | කාම්බෝජය | ප්‍රසක් මයික්‍රොෆයිනෑන්ස් ආයතනයේ ආයෝජනය කර තිබූ 24,475,000 කොටස් ඉවත් කර ගැනීම. |
| 2 | එයිට්කන් ස්පෙන්ස් පී.එල්.සී | බලශක්ති | බංගලාදේශය | බංගලාදේශයේ ඒස් එලියන්ස් පවර් ලිමිටඩ්හි කොටස් 6,400 ක්, හා එලයන්ස් ස්පෙන්ස් පවර් ලිමිටඩ්හි කොටස් 5,100 ක ආයෝජන ඉවත්කර ගැනීම. |
| 3 | නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී | මූල්‍ය | ඇමෙරිකා එක්සත් ජනපදය | යූ එස් ඒ මාස්ටර් කාඩ් එල් එන් සී හි කොටස් 13,590 ක් ඉවත්කර ගැනීම. |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016*

### 2.7.2 අපනයන සැකසුම සඳහා තාවකාලිකව සිදු කරනු ලබන ආනයන පහසුකම් යටතේ සිදු කරනු ලබන ආයෝජන (TIEP)

අපනයන සැකසුම් සඳහා තාවකාලිකව සිදු කරනු ලබන ආනයන පහසුකම් හඳුන්වා දී ඇත්තේ අපනයන ක්ෂ්ත්‍රය ප්‍රවර්ධනය කිරීමට සහ අපනයන අංශය මගින් රටට ප්‍රමාණවත් විදේශ විනිමය ප්‍රමාණයක් ලබා ගැනීම වැඩිදියුණු කිරීමේ අරමුණිනි. තවද, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දිරිගන්වමින් ඔවුන් හට අඩු මිලකට උපකරණ සහ අමුද්‍රව්‍ය ආනයනය කිරීමට අවස්ථාවක් ලබා දෙමින් ඔවුන්ට විදේශ වෙළඳපොල තුළ තරගකාරී ලෙස කටයුතු කිරීමටද අවස්ථාව සලසා දී ඇත.

තවද, ආයෝජන ප්‍රවර්ධන මණ්ඩල පනතේ 16 වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති අපනයන සැකසුම් සඳහා වන අමුද්‍රව්‍ය බදු සහන යටතේ ආනයනය කිරීමට ඉඩ පහසුකම් නොමැති ආයෝජකයන් හට අමුද්‍රව්‍ය ආනයනය කිරීමට පහසුකම් සැපයීම ද අරමුණු කර ඇත. මෙම පහසුකම් යටතේ වන ආයෝජන ඉල්ලීම් සඳහා අනුමැතිය දීමට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට සහය දැක්වීම වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. ඒ අනුව 2016 වසර තුළදී අපනයන සැකසුම් සඳහා තාවකාලිකව සිදු කරනු ලබන අපනයන යටතේ ආයෝජන කිරිම සඳහා වන ඉල්ලීම් පහත 2.17 වගුව මගින් දක්වා ඇත.

**වගුව 2.17 - 2016 වර්ෂයේදී අනුමත කරන ලද විදේශ ආයෝජන**

| අනු පිළිවෙල | ආයතනය | ආයෝජන කේෂ්ත්‍රය | අපනයනික රට | සටහන |
|---|---|---|---|---|
| 1 | ඇකෝ ලේඩ් කොම්පොසයිට් ටෙක්නොලෝජී ස් ලිමිටඩ් | මෝටර් රථ කර්මාන්තය | ජපානය, දකුණු අප්‍රිකාව, ලතින් ඇමෙරිකා, ඇෆ්ගනිස්ථාන්, පාකිස්ථාන්, කාම්බෝජය,පැපු-වා නිවු ගිනියා, වියට්නාමය, බංගලාදේශය, බුරුමය | භාවිතා කළ / අබලි මෝටර් රථ නැවත සකසා අපනයනය කිරීම. |
| 2 | ටෝක්යෝ ඉම්පෝට්ස් ඇන්ඩ් එක්ස්පෝට් කම්පැණි පුද් සමාගම | මෝටර් රථ කර්මාන්තය | ජපානය | මෝටර් සයිකල් නිෂ්පාදන කර්මාන්තය |
| 3 | ඇල්බා ඊ ටෙක් ලංකා පුද්ගලික සමාගම | මෝටර් රථ කර්මාන්තය | දේශීයව බෙදාහරිනු ලබයි | දේශීයව 60% ක් අගය එකතු කර විදුලි ත්‍රීරෝද රථ නිෂ්පාදනය කිරීම.චීනයේ ලොන්ග්වැන්ග් ජින්ග්ෂැන්ග් ආයතනය (60% ක කොටස් හිමි ) සමඟ හවුල් ව්‍යාපාරයක් ලෙස |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016*

### 2.7.3 විනිමය පාලන පනත සම්බන්ධ කටයුතු

ආයෝජකයන් (බලයලත් ඒජන්තවරු / විදේශ විනිමය හුවමාරු කිරීමේ ආයතන) විසින්, විනිමය පාලන දෙපාර්තමේන්තුව මගින් 1953 අංක 24 දරණ විනිමය පාලන පනතේ වගන්ති උල්ලංඝනය කිරීම සම්බන්ධව ඔවුන් වෙත පනවා ඇති දඩ මුදල් ඉවත් කිරීමට හෝ අඩු කිරීමට ඉදිරිපත් කරනු ලබන අභියාචනා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ලැබේ. විනිමය පාලන පනතේ 52 (8) වගන්තිය අනුව මුදල් අමාත්‍යවරයාට ලැබී ඇති බලය ප්‍රකාරව විනිමය පාලන දෙපාර්තමේන්තුව මගින් පනවා ඇති දඩ මුදල් ස්ථිර කිරීම ඉවත් කිරීම හෝ අඩු කිරීමට අනුමැතිය ලබා දෙනු ලබයි. ඒ අනුව 2016 වසර තුළදී ලැබී ඇති අභියාචනා 2.18 වගුවේ දක්වා ඇත.

**වගුව 2.18 - 2016 වසර තුළදී විදේශ විනිමය පාලන පනත යටතේ ලැබී ඇති අභියාචනා**

| අනු පිළිවෙල | අයදුම්කරු | අභියාචනාව | 1953 අංක.24 දරණ විනිමය පාලන පනතේ අදාළ වන වගන්තිය |
|---|---|---|---|
| 1 | සිටි බැන්ක් එන්ඒ කොළඹ | දඩ මුදල ඉවත් කර ගැනීමට | 6,7 වගන්තිය උල්ලංඝනය කිරීම. 52(8) වගන්තිය අනුව අභියාචනා කර ඇත. |
| 2 | අයි ඩබ් එස් ලොජිස්ටික්ස් | දඩ මුදල ඉවත් කර ගැනීමට | 52(8) වගන්තිය අනුව අභියාචනා කර ඇත. |
| 3 | අමානා බැංකුව | දඩ මුදල ඉවත් කර ගැනීමට | 52(8) වගන්තිය අනුව අභියාචනා කර ඇත. |
| 4 | විදුලි ලංකා පී එල් සී | දඩ මුදල ඉවත් කර ගැනීමට | 52(8) වගන්තිය අනුව අභියාචනා කර ඇත. |
| 5 | මයුරි මනි එක්ස්චේන්ජ් | දඩ මුදල ඉවත් කර ගැනීමට | 51 වගන්තිය උල්ලංඝනය කිරීම. |
| 6 | එස් කේ ඉන්වෙස්ට්මන්ට්ස් | දඩ මුදල ඉවත් කර ගැනීමට | 5(1), 7(අ), 10(1), සහ 15(අ), වගන්ති උල්ලංඝනය කිරීම. 52(8) වගන්තිය යටතේ අභියාචනා කර ඇත. |
| 7 | ජී ටී වී එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ් | දඩ මුදල ඉවත් කර ගැනීමට | 52(8) වගන්තිය යටතේ අභියාචනා කර ඇත. |

***මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016***

## 2 .8 ජාත්‍යන්තර සහයෝගිතාවය

### 2 .8. 1 සාර්ක් සංවර්ධන අරමුදල (SDF)

සාර්ක් සංවිධානයේ සියලුම සාමාජික රටවල් විසින් කලාපය තුළ විවිධාකාරයේ අරමුදල් පවත්වා ගැනීම හේතුවෙන් ඇති විය හැකි ගැටළු සහගත තත්ත්වයන් අවම කර ගැනීම පිණිස සාර්ක් වැඩ සටහන්/ ව්‍යාපෘති මූල්‍යනය කළ හැකි එක් යාන්ත්‍රණයක් පිහිටුවා ගැනීමේ අවශ්‍යතාවය මත සාර්ක් සාමාජික රටවල් විසින් සාර්ක් සංවර්ධන අරමුදල පිහිටුවා ගන්නා ලදී.

සමස්ත කාර්යයන් සම්බන්ධීකරණය, ව්‍යාපෘති යෝජනා නිර්දේශ කිරීම, ව්‍යාපෘති ප්‍රගතිය සමාලෝචනය කිරීම, වාර්ෂිකව දායක මුදල් සම්පාදනය කිරීම, සාර්ක් සංවර්ධන අරමුදලේ නිලධාරීන්ගේ ශ්‍රී ලංකා සංචාරවලදී ඔවුනට අවශ්‍ය පහසුකම් සලසා දීම ඇතුළු කාර්යයන් රැසක් සාර්ක් සංවර්ධන අරමුදලේ ශ්‍රී ලංකා ප්‍රතිපාර්ශවීය ආයතනය වශයෙන් මෙම දෙපාර්තමේන්තුව ඉටුකරනු ලැබේ. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් පිළිවෙලින් මෙම අරමුදලේ අධ්‍යක්ෂ හා වෛකල්පිත අධ්‍යක්ෂ වශයෙන් පත් කර ඇත. ඒ අනුව, සමාලෝචිත වසර තුළදී මහා භාණ්ඩාගාර නිලධාරීන් පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නියෝජනය කරන ලදී.

වගුව **2.19 - 2016** දී පවත්වන ලද සාර්ක් සංවර්ධන අරමුදලේ රැස්වීම්

| අනු පිළිවෙල | රැස්වීමේ නම | සහභාගීත්වය | දිනය හා ස්ථානය |
|---|---|---|---|
| 1 | 4 වන පාලන සභාවේ රැස්වීම | එස්.ආර්.ආටිගල මයා<br>නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් | අගෝස්තු 20 භූතානය |
| 2 | 31 වන සාර්ක් මූල්‍ය කණ්ඩායමේ රැස්වීම | අධ්‍යක්ෂ ජනරාල්<br>වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | ඔක්තෝම්බර් 08<br>පාකිස්ථානය |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016*

මෙයට අමතරව, සාර්ක් සංවර්ධන අරමුදල යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් කඩිනමින් ක්‍රියාත්මක කිරිම සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් එම ව්‍යාපෘතීන් හි ප්‍රගතිය සම්බන්ධයෙන් සෘජු අධීක්ෂණයක් කිරීමට වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පදනම් කරගෙන කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් 4 ක් පවත්වා ඇත.

සාර්ක් සංවර්ධන අරමුදලේ මූල්‍යමය අනුග්‍රහ යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

1. සාර්ක් කලාපයේ ගෘහ කර්මාන්ත වල නිරත වන්නන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම පිළිබඳ වැඩසටහන (පියවර I හා II)
2. මාතෘ හා ළමා සෞඛ්‍යය වැඩිදියුණු කිරීමේ වැඩසටහන
3. දකුණු ආසියාවේ ළමා හිංසනය පිටුදැකීමේ වැඩසටහන (SAIEVAC)
4. සාර්ක් රටවල පසු අස්වනු තාක්ෂණ කළමනාකරණය හා පළතුරු නිෂ්පාදන වල අගය එකතු කිරීම පිළිබඳ වැඩසටහන
5. ජලය, සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරිම සඳහා වන වැඩසටහන (WASH)

## **2.8.2**. සාර්ක් මූල්‍ය රැස්වීම්

වර්ෂ 1998 ජූලි මස 29 වන දින කොළඹදී පැවති 10 වන සාර්ක් සමුළුව අතරතුර එකඟ වූ පරිදි සාර්ක් කලාපීය මහ බැංකු අධිපතිවරුන්ගේ හා සාර්ක් කලාපීය මුදල් ලේකම්වරුන්ගේ කලාපීය සබඳතාවයන් උදෙසා 1998 සැප්තැම්බර් මස 09 වන දින " සාර්ක් මූල්‍යය " ආරම්භ විය. කෙසේ වෙතත් මේ සඳහා විධිමත් පිළිගැනීම ලබාගත හැකි වූයේ වර්ෂ 2002 ජනවාරි මස නේපාලයේ කත්මන්ඩු නුවර පැවති 11 වන සාර්ක් සමුළුව අතරවාරයේදී ය.

සාර්ක් මූල්‍ය ජාලයේ මූලික අරමුණ වන්නේ සාර්ක් රටවල ඇති මහ බැංකු හා මුදල් අමාත්‍යංශ අතර සම්බන්ධීකරණය වර්ධනය කිරීමත් අන්‍යොන්‍ය වශයෙන් ඒ ඒ රටවල් විසින් ගනු ලැබූ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ අත්දැකීම් හුවමාරු කරගැනීමත්ය. තවද, සාර්ක් මූල්‍ය පහත සඳහන් අරමුණු වලින් යුතු වේ.

- සාර්ක් කලාපීය රටවල මහ බැංකු හා මුදල් අමාත්‍යංශ අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම උදෙසා කාර්යමණ්ඩල සංචාර හා නිරන්තර තොරතුරු හුවමාරු කිරීම් සිදුකිරීම.
- කලාපීය බැංකුකරණ නීතිරීති සංගෘහිතකරණය කිරීම පිළිබඳ සලකා බැලීම හා යෝජනා කිරීම.
- සාර්ක් කලාපීය රටවල කාර්යක්ෂම ගෙවීම් පද්ධතියක් ඇතිකිරීම සහ මූල්‍ය මෙන්ම විනිමය සම්බන්ධීකරණය උදෙසා කටයුතු කිරීම.
- සමීප සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ අන්‍යොන්‍ය අත්දැකීම් හා අදහස් හුවමාරු කරගැනීම තීව්‍ර කිරීම.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව හා අනෙකුත් ජාත්‍යන්තර ණය දෙන සංවිධානවල ඇති මූල්‍ය දියුණුව පිළිබඳව හා ඒවායේ කලාපීය බලපෑම හා ඒ හරහා ඇතිවන ගැටළු පිළිබඳ අධ්‍යයනය කිරීම.
- ජාත්‍යන්තර මූල්‍ය හා මූල්‍ය පද්ධතින්හි ඇතිවන වෙනස්කම් අධීක්ෂණය කිරීම හා එකී වෙනස්කම් සඳහා කලාපීය වශයෙන් සාමුහිකව කටයුතු කිරීම.
- ජාත්‍යන්තර වශයෙන් හා මූල්‍ය සේවා නිදහස් කිරීම හරහා අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලැබෙන අයුරින් සාධ්‍ය වූත්, සාමුහික විධි ක්‍රම හා උපායමාර්ග පිළිබඳ පොදු වශයෙන් එක්ව තීරණයක් ගැනීම.
- ආර්ථික විද්‍යාව හා මූල්‍යනය සම්බන්ධව විෂය කරුණු පිළිබඳ කලාපීය වශයෙන් මුදල් හා මහ බැංකු කාර්යමණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය ප්‍රතිපත්ති, විනිමය අනුපාත වෙනස්කම්, බැංකු අධීක්ෂණය හා ප්‍රාග්ධන වෙළඳපොළ ගැටළු සම්බන්ධ කලාපීය පුහුණු ආයතන ජාලකරණය කිරීමට කටයුතු කිරීම සහ,
- අන්‍යෝන්‍ය සුභසිද්ධිය උදෙසා වන ආර්ථික හා මූල්‍ය ගැටළු සම්බන්ධයෙන් කරනු ලබන ගවේෂණයන් දිරිගැන්වීම.

මෙම වසර තුළදී සාර්ක් මූල්‍ය සම්බන්ධ රැස්වීම් සඳහා අප දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහභාගිත්වය පහතින් දැක්වේ.

**වගුව 2.20 - 2016 දී පවත්වන ලද සාර්ක් මූල්‍ය රැස්වීම්**

| අනු පිළිවෙල | රැස්වීමේ නම | සහභාගීත්වය | දිනය |
|---|---|---|---|
| 1 | 8thMeeting of SAARC Inter-Governmental Expert Group on Financial Issues | අධ්‍යක්ෂ (ආයෝජන) | 2016.07.20-21<br>ඉස්ලාමාබාද් නුවර පාකිස්ථානය |
| 2 | 24th SAARC FINACE Coordinators meeting | • අධ්‍යක්ෂ (ආයෝජන)<br>• සහකාර අධ්‍යක්ෂ (ආයෝජන) | 2016.09.01<br>ශ්‍රී ලංකාව |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016*

## 2.9 බන්ධිත භාණ්ඩ

රේගු ආඥා පනතේ 69 වන වගන්තිය ප්‍රකාරව රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් නිශ්චිත කොන්දේසිවලට යටත්ව සුවිශේෂී කාර්යයන් සඳහා අදාළ තීරුබදු සහ ගාස්තු සුරක්ෂිත කර ගැනීමෙන් පසුව ආනයනය කරන ලද භාණ්ඩ ගුදම් කර තැබීම හෝ බන්ධිත භාණ්ඩ ලෙස තබා ගැනීම සඳහා ගරු මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ගුදම් හෝ ස්ථාන නම් කරනු ලැබේ.

රේගු ආඥා පනතේ 69 වන වගන්තිය ප්‍රකාරව ස්ථාපිත කර ඇති කවර හෝ ගුදමක් තුළ භාණ්ඩ සැකසීම, නිෂ්පාදනය හෝ එකලස් කිරීම සඳහා රටේ ආර්ථික සංවර්ධනය උදෙසා අවසර ලබා දීමට රේගු ආඥා පනතේ 84 වන වගන්තිය ප්‍රකාරව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට නීතිමය බලය හිමි වේ. දැනට පහත සඳහන් ගුදම් වර්ග පවත්වා ගෙන යනු ලබයි.

- දේශීය පරිභරණයට සහ නැවත අපනයනය සඳහා වන සීනි, සහල් ඇතුළු භාණ්ඩ සැපයීම සඳහා වන ගුදම්
- අපනයනය ප්‍රමුඛ කර්මාන්ත සඳහා භාණ්ඩ සැපයෙන ගුදම්
- සේවා ගුදම්, පෝෂණ බැඳි ගුදම් හා ගුවන් තොටුපලේ හෝ වරායේ ඇති තීරුබදු නිදහස් සාප්පු
- ගුවන් යානා සහ නැව් සඳහා භාණ්ඩ සැපයෙන ගුදම්
- නිෂ්පාදන ගුදම්
- විවිධ රටවලින් ආනයනය කර, ප්‍රති අපනයනය සඳහා ස්ථාපිත කර ඇති ගුදම්
- මගීන් කැටුව නොගෙනෙන ගමන් බඩු නිෂ්කාශන ගුදම්
- සීඝ්‍රගාමී ගුදම් නිෂ්කාශනය (තැපැල් මලු)

බන්ධිත ගුදම්වලට අදාළව රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ අධ්‍යයනය කර ගරු මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයකි. 2016 වර්ෂය තුළදී ගරු මුදල් අමාත්‍යවරයාට බන්ධිත ගුදම් සම්බන්ධයෙන් අයදුම්පත් 12 ක් ඉදිරිපත් කළ අතර ඉන් 5 ක් සඳහා අනුමැතිය හිමි වූ අතර ඉන් එකක් ප්‍රතික්ශේප විය. තවද සිය බන්ධිත ගුදම් තත්වයෙන් ඉවත් වීම සඳහා කරනු ලැබූ ඉල්ලීමක් සඳහා අනුමැතියද ගරු මුදල් අමාත්‍යවරයා ලබා දුන් අතර ඉතිරි අයදුම්පත් 5 අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලියේ පවතී.

තවද පවතින අවශ්‍යතා සහ ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීමේ රජයේ ප්‍රමුඛතාව සැලකිල්ලට ගෙන සහ කර්මාන්ත සංවර්ධන අංශයේ නිර්මාණය වන අවශ්‍යතා සපුරාලීම පිණිස, රේගු ආඥා පනතේ 69 වන වගන්තිය යටතේ පොදු බන්ධිත ගුදම් සඳහා නව ප්‍රතිපත්ති රාමුවක් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.

# 3. පරිපාලන හා මූල්‍ය කාර්ය සාධනය

## 3.1 පාලන අංශය

අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් සැදුම්ලත් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 50 දෙනෙකුගෙන් සමන්විත විය. මෙම දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය 58 ක් වූ අතර 2016 වර්ෂය අවසන් වන විට පුරප්පාඩු 08 ක් පැවතිණි. අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත 3.1 වගුවෙහි දක්වා ඇත. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පරිපාලනය හා මානව සම්පත් සංවර්ධන කාර්යයන් පරිපාලන හා මූල්‍ය අංශය විසින් ඉටු කරන ලදී. මානව සම්පත් කළමණාකරණය පිළිබඳ තොරතුරු 3.2, 3.3, 3.4 හා 3.5 වගුවල දක්වා ඇත.

**වගුව 3.1 - 2016.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය**

| අනු පිළිවෙල | තනතුර | අනුමතසේවක සංඛ්‍යාව | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ලං.ප.සේ.විශේෂ ශ්‍රේණිය) | 01 | 01 | - |
| 2 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(ශ්‍රී.ලං.ප.සේ.විශේෂ ශ්‍රේණිය) | 01 | 01 | - |
| 3 | අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ I) | 03 | 03 | - |
| 4 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේII/ III) | 07 | 04 | 03 |
| 5 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ(ශ්‍රී.ලං.ක්‍ර.සේ II/ III) | 01 | 01 | - |
| 6 | ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග.සේ. II/ III) | 01 | 01 | - |
| 7 | පරිපාලන නිලධාරී (රා.ක.ස.සේ. අධි) | 01 | 01 | - |
| 8 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 02 | 02 | - |
| 9 | පර්යේෂණ සහකාර/සංවර්ධන නිලධාරී | 08 | 07 | 01 |
| 10 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 20 | 16 | 04 |
| 11 | රියදුරු | 05 | 05 | - |
| 12 | කාර්යාල සහායක සේවය | 08 | 08 | - |
| **එකතුව** | | 58 | **50** | **08** |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016*

**වගුව 3.2 - 2016 වර්ෂයේදී දෙපාර්තමේන්තුවට සම්බන්ධවූ නිලධාරීන්**

| අනු පිළිවෙල | නම | තනතුර | දෙපාර්තමේන්තුවට සම්බන්ධවූ දිනය |
|---|---|---|---|
| 1 | එම්.එන්.ඩී. ගුණරත්න මිය | අධ්‍යක්ෂ | 2016.01.08 |
| 2 | ඩී.ටී. සුදර්ශන් මිය | සහකාර අධ්‍යක්ෂ | 2016.02.01 |
| 3 | ඊ.ඒ.පී. ප්‍රසාද් චන්දන මහතා | පරිපාලන නිලධාරී | 2016.09.05 |
| 4 | එස්.එම්. මහගෙදර මිය | සංවර්ධන නිලධාරී | 2016.05.02 |
| 5 | අයි.බී.ඒ. ජයසේකර මෙය | කළමනාකරණ සහකාර | 2016.04.11 |
| 6 | ඩබ්.ආර්.එන්. ප්‍රනාන්දු මිය | කළමනාකරණ සහකාර | 2016.07.18 |
| 7 | ආර්.ඒ.එස්.සී. රණතුංග මිය | කළමනාකරණ සහකාර | 2016.07.05 |
| 8 | ඊ.ඒ.පී.අයි. ගුණසේකර මිය | කළමනාකරණ සහකාර | 2016.07.18 |
| 9 | ජී. දයාරත්න මහතා | රියදුරු | 2016.01.05 |
| 10 | එල්.ඒ. නන්දසේන මහතා | රියදුරු | 2016.01.14 |
| 11 | කේ.ඩබ්.අයි. නිශාන්ත මයා | රියදුරු | 2016.08.10 |
| 12 | එස්.එච්.ඒ. ප්‍රියන්ත මහතා | කාර්යාල කාර්ය සහායක | 2016.07.08 |
| 13 | කේ.එම්. ප්‍රේමරත්න මහතා | කාර්යාල කාර්ය සහායක | 2016.07.18 |

***මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016***

**වගුව 3.3 - 2016 වසරේදී දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු වී ගිය නිලධාරීන්**

| අනු පිළිවෙල | නම | තනතුර |
|---|---|---|
| 1 | එස්.ඩබ්.සී. ජයමිණි මිය | අධ්‍යක්ෂ |
| 2 | එල්.ඒ.ජී.එන්. ලියනාරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 3 | ඩී.කේ. ඔෂානි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 4 | එස්.පී.එම්.ඩී. විජේවර්ධන මහතා | පර්යේෂණ සහකාර |
| 5 | එස්.එල්. විදානපතිරණ මහතා | කළමනාකරණ සහකාර |
| 6 | ඩී.ටී.පී. ගනේගොඩ මිය | කළමනාකරණ සහකාර |
| 7 | ජේ.ඩී.එස්.ඩී.ජේ.ප්‍රනාන්දු මිය | කළමනාකරණ සහකාර |
| 8 | එස්.ඩබ්.ගමගේ මහතා | කළමනාකරණ සහකාර |
| 9 | පී.එම්.එස්.පුෂ්පලතා මිය | කළමනාකරණ සහකාර |
| 10 | එච්.එම්.එල්.ඩී.හේරත් මිය | කළමනාකරණ සහකාර |
| 11 | එන්.සිරිබද්දනගේ මෙය | කළමනාකරණ සහකාර |
| 12 | එල්.ඒ. නන්දසේන මහතා | රියදුරු |
| 13 | ජී. දයාරත්න මහතා | රියදුරු |
| 14 | කේ.ඩබ්.අයි. නිශාන්ත මහතා | රියදුරු |
| 15 | ආර්.කේ.කේ. කුමාරසිරි මහතා | රියදුරු |
| 16 | එස්.එම්.කේ.සමරකෝන් මහතා | කාර්යාල කාර්ය සහායක |
| 17 | එච්.ස්වර්ණසිරි මහතා | කාර්යාල කාර්ය සහායක |
| 18 | එස්.එච්.ඒ.ප්‍රියන්ත මහතා | කාර්යාල කාර්ය සහායක |

***මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016***

**වගුව 3.4 - 2016 වසරේදී පුහුණු පාඨමාලා/ අධ්‍යයන චාරිකා /විදේශ සම්මන්ත්‍රණ**

| තනතුර | නම | රට | සහභාගීත්වය | කාලය |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | කේ.ඩී.එන්. රංජිත් අසෝක මහතා | ජපානය | සම්මන්ත්‍රණ | 22.02.2016<br>26.02.2016 |
| | | ඇමරිකා එක්සත් ජනපදය | පුහුණු වැඩසටහන් | 25.04.2016<br>30.04.2016 |
| | | බෙල්ජියම | නියෝජිත මණ්ඩල සමුළු | 11.05.2016 |
| | | පාකිස්තානය | රැස්වීම් | 22.08.2016<br>27.08.2016 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | කේ.ඒ.එස්.එස්.කේ. පෙරේරා මහතා | දකුණු කොරියාව | පුහුණු වැඩසටහන් | 04.04.2016<br>08.04.2016 |
| | | මාලදිවයින | රැස්වීම් | 25.05.2016<br>26.05.2016 |
| අධ්‍යක්ෂ | බී.පී.සී. කුලරත්න මහතා | ඉන්දියාව | පුහුණු වැඩසටහන් | 22.09.2016<br>23.09.2016 |
| | | පිලිපීනය | සම්මන්ත්‍රණ | 22.11.2016<br>24.11.2016 |
| | කේ.ඒ. විමලේන්තිරරාජා මහතා | ජපානය | සම්මන්ත්‍රණ | 23.02.2016<br>25.02.2016 |
| | | ඇමරිකා එක්සත් ජනපදය | පුහුණු වැඩසටහන් | 04.04.2016<br>15.04.2016 |
| | | තායිලන්තය | නියෝජිත මණ්ඩල සමුළු | 15.05.2016<br>19.05.2016 |
| | | සිංගප්පූරුව | නියෝජිත මණ්ඩල සමුළු | 06.06.2016 |
| | | ඇමරිකා එක්සත් ජනපදය | පුහුණු වැඩසටහන් | 21.08.2016<br>02.09.2016 |
| | | ඉන්දියාව | නියෝජිත මණ්ඩල සමුළු | 29.09.2016<br>30.09.2016 |
| | | ස්විට්සර්ලන්තය | නියෝජිත මණ්ඩල සමුළු | 01.11.2016<br>03.11.2016 |
| | | චීනය | නියෝජිත මණ්ඩල සමුළු | 21.11.2016<br>23.11.2016 |
| | | සිංගප්පූරුව | නියෝජිත මණ්ඩල සමුළු | 13.12.2016<br>15.12.2016 |
| | එම්.එන්.ඩී. ගුණරත්න මිය | පාකිස්තානය | රැස්වීම් | 20.07.2016<br>21.07.2016 |
| සහකාර අධ්‍යක්ෂ | එම්.ඩී.ජේ.සී. මුරගේ මහතා | තායිලන්තය | රැස්වීම් | 06.09.2016<br>07.09.2016 |
| | ආර්.එල්. වීරසේකර මහතා | චීනය | පුහුණු වැඩසටහන් | 22.09.2016<br>28.09.2016 |

| | | | | |
|---|---|---|---|---|
| | ඩබ්.ඊ. ගොඩගම මිය | තායිලන්තය | පුහුණු වැඩසටහන් | 24.07.2016<br>31.07.2016 |
| සංවර්ධන නිලධාරි | එම්. නන්දනී මෙය | චීනය | පුහුණු වැඩසටහන් | 07.09.2016<br>27.09.2016 |
| | බී.එල්. සුදර්ශන මහතා | චීනය | පුහුණු වැඩසටහන් | 19.05.2016<br>08.06.2016 |
| | එස්.ඩබ්.ජී.එම්. කරුණාරත්න මහතා | චීනය | පුහුණු වැඩසටහන් | 19.05.2016<br>08.06.2016 |
| | ජේ.ඒ.ඩී.යූ. රණසිංහ මිය | චීනය | පුහුණු වැඩසටහන් | 25.05.2016<br>14.06.2016 |
| | කේ.එම්.ජී.ඒ. කස්තුරි මෙය | සිංගප්පූරුව | පුහුණු වැඩසටහන් | 01.08.2016<br>12.08.2016 |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016*

**වගුව 3.5 දේශීය පුහුණු පාඨමාලා /අධ්‍යයන චාරිකා/සම්මන්ත්‍රණ - 2016**

| තනතුර | නම | පාඨමාලාව | කාලය |
|---|---|---|---|
| අධ්‍යක්ෂ | කේ.ඒ. විමලේන්තිරරාජා මහතා | Microeconomic for Public Management and Policy Analysis | 11.08.2016<br>12.08.2016 |
| | | Trade in Service Workshop | 27.06.2016<br>28.06.2016 |
| සහකාර අධ්‍යක්ෂ | එම්.ඩී.ජේ.සී. මුරගේ මහතා | Trade in Service Workshop | 27.06.2016<br>28.06.2016 |
| | | Finance Management for non Finance Managers | 09.08.2016 |
| | එච්.ජී.ටී. ප්‍රසංගිකා මිය | Sri Lanka Economic Association (SLEA)Annual Session 2016 | 21.10.2016<br>22.10.2016 |
| | | Capacity Building Program forthe Officers of Sri Lanka Administrative Serveices(SLSAS)- class III | 21.11.2016<br>25.11.2016 |
| | ජී.ඩී.එස්.පී. කුමාර මහතා | Trade in Service Workshop | 27.06.2016<br>28.06.2016 |
| | | Finance Management for non Finance Managers | 09.08.2016 |
| | | Training Programme on Management | 13.06.2016<br>17.06.2016 |
| | | Introdution and Market Accessories Analysis Tools and (Quantitative) Analyzing Trade Agreement | 29.11.2016 |

| | | | |
|---|---|---|---|
| | | Negotiation of Bilateral and Regional Trade Agreement | 30.11.2016 |
| | | Formulation a National Trade Policy | 01.12.2016 |
| | ආර්.එල්. වීරසේකර මහතා | Finance Management for Non Finance Managers | 09.08.2016 |
| | ඩබ්.ඊ. ගොඩගම මිය | Microeconomic for Public Management and Policy Analysis | 11.08.2016<br>12.08.2016 |
| පර්යේෂණ සහකාර | කේ.ඩී.ජේ.වසන්ත මයා | Trade in Service Workshop | 27.06.2016<br>28.06.2016 |
| සංවර්ධන නිලධාරී | එස්.එම්.මහගෙදර මිය | Trade in Service Workshop | 27.06.2016<br>28.06.2016 |
| | | Introdution and Market Accessories Analysis Tools and (Quantitative) Analyzing Trade Agreement | 29.11.2016 |
| | කේ.එම්.ජී.ඒ.කස්තුරි මෙය | Trade in Service Workshop | 27.06.2016<br>28.06.2016 |
| | | Negotiation of Bilateral and Regional Trade Agreement | 30.11.2016 |
| | එස්.ඩබ්.ජී.එම්.කරුණාර ත්න මයා | Formulation a National Trade Policy | 01.12.2016 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | ඩබ්.එස්.පී. පෙරේරා මිය | 1 ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ඉලක්කකරගත් වැඩමුළුව | 07.10.2016<br>08.10.2016 |
| | එම්. කිරුහා මිය | Certificate in SLIDA Computer Driving Licence (SLIDA-CDL) | 14.03.2016<br>01.04.2016 |
| | | File Management & General Office Administration & e Code | 21.11.2016<br>23.11.2016 |
| | එන්.සිරිබද්දනගේ මෙය | Certificate in SLIDA Computer Driving Licence (SLIDA-CDL) | 14.03.2016<br>01.04.2016 |
| | | Maintenance of Office Equipments | 11.08.2016<br>12.08.2016 |
| | එම්.ඒ.ඩී.එස්. මල්ලවආරච්චි මිය | ඊ.රාජ්‍ය සංකල්පය සහ කාර්යාල කළමණාකරණයේ දිතොරතුරු තාක්ෂණය භාවිතය පිලිබඳ වැඩමුළුව | 07.11.2016<br>08.11.2016 |
| | එම්.ජී.එම්.ඩී.විමලරත්න මෙය | Diploma in information Technology | 13.03.2016<br>16.10.2016 |
| | ඒ. දිසානායක මිය | Diploma in information Technology | 13.03.2016<br>16.10.2016 |
| | | Financial Regulations in the Public Sector | 21.11.2016<br>22.11.2016 |

| | | | |
|---|---|---|---|
| | ඩබ්.ඒ.එන්. වික්‍රමසිංහ මිය | Diploma in informati on Technology | 13.03.2016<br>16.10.2016 |
| | | ගිණුම් පොත්පත් ක්‍රමානුකූලව නඩත්තු කිරිම | 29.08.2016<br>30.08.2016 |
| | එම්.එන්. දිල්රුක්ෂි මිය | Workshopson salary conversion | 12.05.2016<br>13.05.2016 |
| | | Financial Regulations in the Public Sector | 21.11.2016<br>22.11.2016 |
| | | ගිණුම්කරණය පිලිබඳ පුහුණු වැඩමුළුව | 27.08.2016 |
| | ටී.එම්. අමරදාස මහතා | Workshops on salary conversion | 12.05.2016<br>13.05.2016 |
| | ඩබ්.ආර්.ආර්. වික්‍රමසිංහ මෙය | Workshops on salary conversion | 12.05.2016<br>13.05.2016 |
| | අයි.බී.ඒ. ජයසේකර මෙය | Workshop son salary conversion | 12.05.2016<br>13.05.2016 |
| | | ඊ.රාජ්‍ය සංකල්පය සහ කාර්යාල කළමණාකරණයේ දි තොරතුරු තාක්ෂණය භාවිතය පිලිබඳ වැඩමුළුව | 07.11.2016<br>08.11.2016 |
| රියදුරු | කේ.ඩී. තුසිත මහතා | රියදුරන් සඳහා එක් දින වැඩමුළුව | 01.03.2016 |
| | | විද්‍යාත්මක පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම - රියදුරු සේවය | 06.09.2016 |
| | | පුහුණු වැඩමුළුව - රියදුරු සේවය | 20.03.2016 |
| | ආර්.ඒ.ඩී.සී.ප්‍රියදර්ශන මහතා | රියදුරන් සඳහා එක් දින වැඩමුළුව | 01.03.2016 |
| | | විද්‍යාත්මක පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම - රියදුරු සේවය | 06.09.2016 |
| | | පුහුණු වැඩමුළුව - රියදුරු සේවය | 20.03.2016 |
| | එල්.ඒ. නන්දසේන මහතා | පුහුණු වැඩමුළුව - රියදුරු සේවය | 20.03.2016 |
| | එල්.ඒ.වී.සී. ජිනේන්ද්‍ර මහතා | පුහුණු වැඩමුළුව - රියදුරු සේවය | 20.03.2016 |
| | කේ. ජයසිරි මහතා | රියදුරු පුහුණු වැඩමුළුව - දෙවන අදියර | 01.10.2016 |
| කාර්යාල කාර්ය සහායක | ඩබ්.ජී.එම්.ගුණවර්ධන මිය | ඉහළ ශ්‍රම ඵලදායිතාවය සඳහා කාර්යාල කාර්ය සහායක කාර්යභාරය | 18.03.2016 |
| | ඩී.එස්.එන්.සුරංග මයා | ඉහළ ශ්‍රම ඵලදායිතාවය සඳහා කාර්යාල කාර්ය සහායක කාර්යභාරය | 16.06.2016<br>17.06.2016 |
| | ඒ.කේ.පි.ආර්.උබේසේකර මයා | ඉහළ ශ්‍රම ඵලදායිතාවය සඳහාකාර්යාල කාර්ය සහායක කාර්යභාරය | 16.06.2016<br>17.06.2016 |

| | | | |
|---|---|---|---|
| කාර්යාල කාර්ය සහායක | ඩබ්ලිව්.ජී.එම්.ගුණවර්ධන මිය | කාර්යාල කාර්ය සහායකවරුන් සඳහා ඉහළ කම්කරු එලදායිත්වය | 2016.03.08 |
| | ඩී.එස්.එන්.සුරංග මයා | කාර්යාල කාර්ය සහායකවරුන් සඳහා ඉහළ කම්කරු එලදායිත්වය | 2016.06.16<br>2016.06.17 |
| | ඒ.කේ.පී.ආර්.උබේසේකර මයා | කාර්යාල කාර්ය සහායකවරුන් සඳහා ඉහළ කම්කරු එලදායිත්වය | 2016.06.16<br>2016.06.17 |

***මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016***

## 3.2 විශේෂ ව්‍යාපෘති යෝජනාක්‍රම

### 3.2.1 රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම

2016 අයවැය යෝජනාවකට අනුව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 යටතේ රජයේ නිලධාරීන්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරීන් සඳහා සහනදායි පදනම යටතේ වාහන ආනයන බලපත්‍ර ලබාදීමේ යෝජනා ක්‍රමය 2015.11.21 වන දින සිට බලපැවැත්වෙන අතර 2016 වර්ෂය සඳහා ඉහත චක්‍රලේඛයට අනුව වාහන ආනයන බලපත්‍ර 1,020 ක් නිකුත් කර ඇත.

### 3.2.2 රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම

2016 අයවැය යෝජනාවකට අනුව අත්හිටුවන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 යටතේ සහනදායි පදනම යටතේ වාහන ආනයන බලපත්‍ර ලබාදීමේ යෝජනා ක්‍රමය 2016.05.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව 2015.11.21 වන දින සිට බලපැවැත්වෙන පරිදි නැවත ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව 2016.06.14 දිනැති සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(XXXII) හි විධිවිධාන යටතේ එම වසර තුල වාහන ආනයන බලපත්‍ර 228 ක් නිකුත් කර ඇත.

## 3.3 මූල්‍ය අංශය

දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපාදන වලින් පුනරාවර්තන වියදම් සඳහා රු. 49,925,000 ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රු.5,100,000 ක ප්‍රතිපාදන ද ඇතුළුව රු.55,025,000 ප්‍රතිපාදන මුදලක් 2016 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් වැය ශීර්ෂ 244 වැඩ සටහන 01 හා ව්‍යාපෘතිය 01 යටතේ වෙන්කර තිබුණි. වසර තුළ මුළු සත්‍ය වියදම් රු.50,148,002 ක් වූ අතර සත්‍ය පුනරාවර්තන වියදම හා ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රු.47,066,000ක් හා රු3,082,002 ක් විය. එකී වර්ෂය තුළ එම වියදම සිදුවූ ආකාරයත්, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ විස්තරත් පිළිවෙලින් පහත වගු අංක 3.6 සහ 3.7 මගින් පෙන්නුම් කෙරේ.

වගුව 3.6 - 2016 වර්ෂය තුළ අයවැය ඇස්තමේන්තු උපයෝජනය

| අනු පිළිවෙල | වියදම් පිළිබඳ විස්තරය | අයවැය 2016 (රු.) | 2016 සත්‍ය වියදම (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 1 | පුනරාවර්තන වියදම් | | | |
| | පුද්ගල පඩිනඩි | 31,500,000 | 30,652,898 | 97.3 |
| | ගමන් වියදම් | 6,800,000 | 6,458,277 | 95.0 |
| | සැපයීම් | 2,725,000 | 2,651,384 | 97.0 |
| | නඩත්තු වියදම් | 2,050,000 | 1,803,809 | 88.0 |
| | සේවා | 5,900,000 | 4,819,710 | 82.0 |
| | මාරුකිරීම් | 950,000 | 679,922 | 71.5 |
| | **මුළු එකතුව** | **49,925,000** | **47,066,000** | **94.2** |
| 2 | ප්‍රාග්ධන වියදම් | | | |
| | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 200,000 | **-** | **-** |
| | ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම | 4,000,000 | 2,214,745 | 55.4 |
| | හැකියා වර්ධනය | 900,000 | 867,257 | 96.3 |
| | **මුළු එකතුව** | **5,100,000** | **3,082,002** | **60.4** |
| | **මුළු එකතුව** | **55,025,000** | **50,148,002** | **88.9** |

***මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016***

පහත 3.7 වගුවෙන් පෙන්වා ඇති පරිදි වර්ෂය තුළ පාර්ලිමේන්තුවෙන් අනුමත කරන ලද සීමාවන් තුළ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම පවත්වාගෙන යාමට දෙපාර්තමේන්තුවට හැකි විය.

වගුව 3.7 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම2016

| අනු පිළිවෙල | විස්තරය | අනුමත ප්‍රමාණය (රු.) | සත්‍ය මුදල් වටිනාකම (රු) |
|---|---|---|---|
| 1 | වියදමේ උපරිම සීමාව | 2,000,000 | 1,999,994 |
| 2 | ලැබීම් වල අවම සීමාව | 1,300,000 | 1,881,690 |
| 3 | හර ශේෂයේ උපරිම සීමාව | 12,000,000 | 8,074,401 |

***මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016***

## 3.4 විගණන විමසුම්

විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරන ලද සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදුන් අතර අවශ්‍ය අවස්ථාවලදී දුර්වලතා මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදි.

# 4. ඇමුණුම්

ඇමුණුම - I

**වගුව 4.1 සංයෝජිත වර්ගීකරණ සඳහා ජාතික උප බෙදුම් - 2016**

| අනු අංකය | සංයෝජිත වර්ගීකරණ සංකේතය | 2016 දී විස්තරය | බදු අනුපාතය |
|---|---|---|---|
| 1 | 1207.10.10 | පැල කිරීම සඳහා වන රසායනිකව සංකලනය කරන ලද තල් ඇට | නිදහස් |
| 2 | 1207.10.90 | අනෙකුත් | 30% |
| 3 | 1511.90.30 | පිරිපහදු නොකළ පාම් ඔලේන් | 30% හෝ කි.ග්‍රැමයට රු 66/- |
| 4 | 2203.00.10 | කෑන් බීර මිලි ලීටර් 350 ට වඩා අඩු | ලීටරයට රු. 500/- |
| 5 | 2203.00.20 | කෑන් බීර මිලි ලීටර් 350ක් හෝ ඊට වැඩි | ලීටරයට රු. 500/- |
| 6 | 2203.00.90 | අනෙකුත් | ලීටරයට රු. 500/- |
| 7 | 2206.00.10 | අමද්‍යප පාන වර්ග | ලීටරයට රු. 400/- |
| 8 | 2206.00.90 | අනෙකුත් | ලීටරයට රු. 400/- |
| 9 | 3215.90.10 | බෝල් පොයින්ට් පෑන් සඳහා වන තීන්ත | නිදහස් |
| 10 | 3401.30.10 | තෙත් සහිත පිරිසිදුකාරක කඩදාසි, වොඩින් ,ෆෙල්ට් හෝ නොවියන ලද රෙදි | 30% |
| 11 | 3401.30.90 | අනෙකුත් | 30% |
| 12 | 3402.11.10 | තෙත් සහිත පිරිසිදුකාරක කඩදාසි, වොඩින් ,ෆෙල්ට් හෝ නොවියන ලද රෙදි | නිදහස් |
| 13 | 3402.11.90 | අනෙකුත් | නිදහස් |
| 14 | 3402.12.10 | තෙත් සහිත පිරිසිදුකාරක කඩදාසි, වොඩින් ,ෆෙල්ට් හෝ නොවියන ලද රෙදි | නිදහස් |
| 15 | 3402.12.90 | අනෙකුත් | නිදහස් |
| 16 | 3402.13.10 | තෙත් සහිත පිරිසිදුකාරක කඩදාසි, වොඩින් ,ෆෙල්ට් හෝ නොවියන ලද රෙදි | නිදහස් |
| 17 | 3402.13.90 | අනෙකුත් | නිදහස් |
| 18 | 3402.19.10 | තෙත් සහිත පිරිසිදුකාරක කඩදාසි, වොඩින් ,ෆෙල්ට් හෝ නොවියන ලද රෙදි | නිදහස් |
| 19 | 3402.19.90 | අනෙකුත් | නිදහස් |
| 20 | 3402.20.20 | තෙත් සහිත පිරිසිදුකාරක කඩදාසි, වොඩින් ,ෆෙල්ට් හෝ නොවියන ලද රෙදි | 30% |
| 21 | 3403.19.10 | මෝටර් වාහන සඳහා භාවිතා කරනු ලබන ලිහිසි තෙල් | 30% |
| 22 | 3403.19.90 | අනෙකුත් | නිදහස් |
| 23 | 3403.99.10 | මෝටර් වාහන සඳහා භාවිතා කරනු ලබන ලිහිසි තෙල් | 30% |
| 24 | 3403.99.90 | අනෙකුත් | නිදහස් |
| 25 | 3603.00.10 | ආරක්ෂක වෙඩි නූල් | 15% |
| 26 | 3603.00.20 | ප්‍රස්පෝටක වෙඩි නූල් | 15% |
| 27 | 3603.00.30 | ගැටීමෙන් ගිණිගන්නා කැප් වර්ග | 15% |
| 28 | 3603.00.40 | ප්‍රස්පෝටක කැප් වර්ග | 15% |
| 29 | 3603.00.50 | ගිනිකාරක | 15% |
| 30 | 3603.00.60 | විද්‍යුත් ප්‍රස්පෝටක | 15% |
| 31 | 3824.90.20 | මාර්ග සලකුණු තීන්ත | 15% |
| 32 | 3924.90.20 | බැර ලෝහ , ශුද්‍ර ජීවීන් සහ රසායනික ද්‍රව්‍ය අවශෝෂනය කිරීම සඳහා මයික්‍රෝ පෙරන වලින් සමන්විත ලීටර් 1 ට වඩා වැඩි නොවන වතුර බෝතල් | නිදහස් |

| | | | |
|---|---|---|---|
| 33 | 4011.20.11 | සලකුණු නොමැති ටයර් ආවරණය | 15% හෝ කි.ග්‍රෑමයට රු 80/- |
| 34 | 4011.20.19 | අනෙකුත් | 15% හෝ කි.ග්‍රෑමයට රු 80/- |
| 35 | 4418.71.20 | උණ බම්බුවලින් | නිදහස් |
| 36 | 4418.72.20 | උණ බම්බුවලින් | නිදහස් |
| 37 | 4418.90.10 | උණ බම්බුවලින් | නිදහස් |
| 38 | 4418.90.90 | අනෙකුත් | 30% |
| 39 | 4818.20.10 | තෙත් සහිත පිරිසිදුකාරක සව්කොල | 30% |
| 40 | 4818.20.90 | අනෙකුත් | 30% |
| 41 | 5603.11.10 | තෙත් සහිත පිරිසිදු කාරක නොවියන ලද රෙදි | නිදහස් |
| 42 | 5603.11.90 | අනෙකුත් | නිදහස් |
| 43 | 8302.10.20 | වානේ | 30% හෝ කි.ග්‍රෑමයට රු. 60/- |
| 44 | 8421.29.10 | අපහරණය කළ හැකි ජීවානුහරණය කරන ලද කාන්දු පෙරණය | නිදහස් |
| 45 | 8421.29.90 | අනෙකුත් | නිදහස් |
| 46 | 8427.90.10 | හයිඩ්‍රොලික් ජැක්කුවක් සහිත අතින් ක්‍රියාකරන තට්ටු ට්‍රක් රථය | නිදහස් |
| 47 | 8427.90.90 | අනෙකුත් | නිදහස් |
| 48 | 8703.21.64 | භූමියේ සියළුතැන යාහැකි වාහන (ATV) | නිදහස් |
| 49 | 8703.21.73 | භූමියේ සියළුතැන යාහැකි වාහන (ATV) | නිදහස් |
| 50 | 8703.23.54 | සිලිංඩර් ධාරිතාවය ඝන සෙන්ටි මීටර් 1600 ඉක්මවන එහෙත් ඝන සෙන්ටි මීටර් 1800 නොඉක්මවන දෙමුහුන් (හයිබ්‍රිඩ්) විදුලි වාහන | 15% |
| 51 | 8703.23.55 | අනෙකුත්, සිලිංඩර් ධාරිතාවය ඝන සෙන්ටි මීටර් 1600 ඉක්මවන එහෙත් ඝන සෙන්ටි මිටර් 1800 නොඉක්මවන | 30% |
| 52 | 8703.23.56 | අනෙකුත්,දෙමුහුන් (හයිබ්‍රිඩ් ) විදුලි වාහන | 15% |
| 53 | 8703.23.59 | අනෙකුත් | 30% |
| 54 | 8703.23.64 | සිලිංඩර් ධාරිතාවය ඝන සෙන්ටි මීටර් 1600 ඉක්මවන එහෙත් ඝන සෙන්ටි මීටර් 1800 නොඉක්මවන දෙමුහුන් (හයිබ්‍රිඩ්) විදුලි වාහන | 15% |
| 55 | 8703.23.65 | අනෙකුත්, සිලිංඩර් ධාරිතාවය ඝන සෙන්ටි මීටර් 1600 ඉක්මවන එහෙත් ඝන සෙන්ටි මිටර් 1800 නොඉක්මවන | 30% |
| 56 | 8703.23.66 | අනෙකුත්,දෙමුහුන් (හයිබ්‍රිඩ් ) විදුලි වාහන | 15% |
| 57 | 8703.23.69 | අනෙකුත් | 30% |
| 58 | 8703.32.54 | සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර් 1600 ඉක්මවන එහෙත් ඝන සෙන්ටි මීටර් 1800 නොඉක්මවන දෙමුහුන් (හයිබ්‍රිඩ්) විදුලි වාහන | 15% |
| 59 | 8703.32.55 | අනෙකුත්, සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර් 1600 ඉක්මවන එහෙත් ඝන සෙන්ටි මිටර් 1800 නොඉක්මවන | 30% |
| 60 | 8703.32.56 | අනෙකුත්, දෙමුහුන් (හයිබ්‍රිඩ්) විදුලි වාහන | 15% |
| 61 | 8703.32.59 | අනෙකුත් | 30% |
| 62 | 8703.32.62 | සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර් 1600 නොඉක්මවන දෙමුහුන් (හයිබ්‍රිඩ්) විදුලි වාහන | 15% |
| 63 | 8703.32.63 | අනෙකුත්, සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර් 1600 නොඉක්මවන | 30% |
| 64 | 8703.32.64 | සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර් 1600 ඉක්මවන එහෙත් ඝන සෙන්ටි මීටර් 1800 නොඉක්මවන දෙමුහුන් (හයිබ්‍රි ) විදුලි වාහන | 15% |
| 65 | 8703.32.65 | අනෙකුත්, සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර් 1600 ඉක්මවන එහෙත් ඝන සෙන්ටි මිටර් 1800 නොඉක්මවන | 30% |

| | | | |
|---|---|---|---|
| 66 | 8703.32.69 | අනෙකුත් | 30% |
| 67 | 8703.90.41 | අවුරුදු තුනකට වඩා නොපැරණි | 15% |
| 68 | 8703.90.42 | අවුරුදු තුනකට වඩා පැරණි | 30% |
| 69 | 8703.90.51 | මෝටර්වල ධාරිතාවය කිලෝ වොට් 50 නොඉක්මවන | 15% |
| 70 | 8703.90.52 | මෝටර්වල ධාරිතාවය කිලෝ වොට් 50 ඉක්ම වන එහෙත්, කිලෝ වොට් 100 නොඉක්මවන | 15% |
| 71 | 8703.90.53 | මෝටර්වල ධාරිතාවය කිලෝ වොට් 100 ඉක්ම වන එහෙත් කිලෝ වොට් 200 නොඉක්මවන | 15% |
| 72 | 8703.90.54 | මෝටර්වල ධාරිතාවය කිලෝ වොට් 200 ඉක්මවන | 15% |
| 73 | 8703.90.61 | මෝටර්වල ධාරිතාවය කිලෝ වොට් 50 නොඉක්මවන | 30% |
| 74 | 8703.90.62 | මෝටර්වල ධාරිතාවය කිලෝ වොට් 50 ඉක්ම වන එහෙත් කිලෝවොට් 100 නොඉක්මවන | 30% |
| 75 | 8703.90.63 | මෝටර්ටර්වල ධාරිතාවය කිලෝ වොට් 100 ඉක්මවන එහෙත් කිලෝවොට් 200 නොඉක්මවන | 30% |
| 76 | 8703.90.64 | මෝටර්වල ධාරිතාවය කිලෝ වොට් 200 ඉක්මවන | 30% |
| 77 | 8703.90.71 | මෝටර්වල ධාරිතාවය කිලෝ වොට් 50 නොඉක්මවන | 15% |
| 78 | 8703.90.72 | මෝටර්වල ධාරිතාවය කිලෝ වොට් 50 ඉක්ම වන එහෙත් කිලෝවොට් 100 නොඉක්මවන | 15% |
| 79 | 8703.90.73 | මෝටර්ටර්වල ධාරිතාවය කිලෝ වොට් 100 ඉක්මවන එහෙත් කිලෝවොට් 200 නොඉක්මවන | 15% |
| 80 | 8703.90.74 | මෝටර්වල ධාරිතාවය කිලෝ වොට් 200 ඉක්මවන | 15% |
| 81 | 8703.90.81 | මෝටර්වල ධාරිතාවය කිලෝ වොට් 50 නොඉක්මවන | 30% |
| 82 | 8703.90.82 | මෝටර්වල ධාරිතාවය කිලෝ වොට් 50 ඉක්ම වන එහෙත්, කිලෝ වොට් 100 නොඉක්මවන | 30% |
| 83 | 8703.90.83 | මෝටර්වල ධාරිතාවය කිලෝ වොට් 100 ඉක්ම වන එහෙත් කිලෝ වොට් 200 නොඉක්මවන | 30% |
| 84 | 8703.90.84 | මෝටර්වල ධාරිතාවය කිලෝ වොට් 200 ඉක්මවන | 30% |
| 85 | 8703.90.93 | අනෙකුත් විදුලි වාහන අවුරුදු තුනකට වඩා නොපැරණි | 15% |
| 86 | 8703.90.94 | අනෙකුත් විදුලි වාහන අවුරුදු තුනකට වඩා පැරණි | 30% |
| 87 | 8703.90.95 | අනෙකුත්, අවුරුදු තුනකට වඩා නොපැරණි | 15% |
| 88 | 8703.90.99 | අනෙකුත්, අවුරුදු තුනකට වඩා පැරණි | 30% |
| 89 | 8704.22.41 | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත වූ ටැන්කර් සහ බවුසර් සහ ශීතාගාරික ට්‍රක් රථ - අවුරුදු පහකට වඩා නොපැරණි | නිදහස් |
| 90 | 8704.22.42 | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත වූ ටැන්කර් සහ බවුසර් සහ ශීතාගාරික ට්‍රක් රථ - අවුරුදු පහකට වඩා පැරණි එහෙත්, අවුරුදු 10 කට වඩා නොපැරණි | නිදහස් |
| 91 | 8704.22.43 | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත වූ ටැන්කර් සහ බවුසර් සහ ශීතාගාරික ට්‍රක් රථ - අවුරුදු දහයකට වඩා පැරණි | නිදහස් |
| 92 | 8704.22.51 | හකුලා ගැනීමේ යන්ත්‍රනය සහිත කසල අපහරණ රථ අවුරුදු පහකට වඩා නොපැරණි | නිදහස් |
| 93 | 8704.22.52 | හකුලා ගැනීමේ යන්ත්‍රනය සහිත කසල අපහරණ රථ අවුරුදු පහකට වඩා පැරණි | නිදහස් |
| 94 | 8704.22.61 | අනෙකුත් අවුරුදු පහකට වඩා නොපැරණි | නිදහස් |
| 95 | 8704.22.62 | අනෙකුත් අවුරුදු පහකට වඩා පැරණි එහෙත්, අවුරුදු දහයකට වඩා නොපැරණි | නිදහස් |

| | | | |
|---|---|---|---|
| 96 | 8704.22.63 | අනෙකුත් අවුරුදු දහයකට වඩා පැරණි | නිදහස් |
| 97 | 8704.23.51 | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත වූ ටැන්කර් සහ බවුසර් සහ ශීතාගාරික ට්‍රක් රථ අවුරුදු පහකට වඩා නොපැරණි | නිදහස් |
| 98 | 8704.23.52 | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත වූ ටැන්කර් සහ බවුසර් සහ ශීතාගාරික ට්‍රක් රථ අවුරුදු පහකට වඩා පැරණි එහෙත්, අවුරුදු 10 කට වඩා නොපැරණි | නිදහස් |
| 99 | 8704.23.53 | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත වූ ටැන්කර් සහ බවුසර් සහ ශීතාගාරික ට්‍රක් රථ අවුරුදු දහයකට වඩා පැරණි | නිදහස් |
| 100 | 8704.23.61 | හකුලා ගැනීමේ යන්ත්‍රනය සහිත කසල අපහරණ රථ අවුරුදු පහකට වඩා නොපැරණි | නිදහස් |
| 101 | 8704.23.62 | හකුලා ගැනීමේ යන්ත්‍රනය සහිත කසල අපහරණ රථ අවුරුදු පහකට වඩා පැරණි | නිදහස් |
| 102 | 8704.23.71 | අනෙකුත් අවුරුදු පහකට වඩා නොපැරණි | නිදහස් |
| 103 | 8704.23.72 | අනෙකුත් අවුරුදු පහකට වඩා පැරණි එහෙත්, අවුරුදු දහයකට වඩා නොපැරණි | නිදහස් |
| 104 | 8704.23.73 | අනෙකුත් අවුරුදු දහයකට වඩා පැරණි | නිදහස් |
| 105 | 8704.32.41 | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත වූ ටැන්කර් සහ බවුසර් සහ ශීතාගාරික ට්‍රක් රථ අවුරුදු පහකට වඩා නොපැරණි | නිදහස් |
| 106 | 8704.32.42 | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත වූ ටැන්කර් සහ බවුසර් සහ ශීතාගාරික ට්‍රක් රථ අවුරුදු පහකට වඩා පැරණි එහෙත්, අවුරුදු 10 කට වඩා නොපැරණි | නිදහස් |
| 107 | 8704.32.43 | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත වූ ටැන්කර් සහ බවුසර් සහ ශීතාගාරික ට්‍රක් රථ අවුරුදු දහයකට වඩා පැරණි | නිදහස් |
| 108 | 8704.32.13 | හකුලා ගැනීමේ යන්ත්‍රනය සහිත කසල අපහරණ රථ අවුරුදු පහකට වඩා නොපැරණි | නිදහස් |
| 109 | 8704.32.14 | හකුලා ගැනීමේ යන්ත්‍රනය සහිත කසල අපහරණ රථ අවුරුදු පහකට වඩා පැරණි | නිදහස් |
| 110 | 8704.32.61 | අනෙකුත් අවුරුදු පහකට වඩා නොපැරණි | නිදහස් |
| 111 | 8704.32.62 | අනෙකුත් අවුරුදු පහකට වඩා පැරණි එහෙත්, අවුරුදු දහයකට වඩා නොපැරණි | නිදහස් |
| 112 | 8704.32.63 | අනෙකුත් අවුරුදු දහයකට වඩා පැරණි | නිදහස් |
| 113 | 8707.10.10 | කොටස් හා උපාංග වලින් පූර්ණ වශයෙන් සමන්විත භාවිත කළ වාහන බඳ | 15% |
| 114 | 8707.10.20 | කොටස්හාඋපාංගවලින්පූර්ණවශයෙන්සමන්විතඅ නෙකුත් වාහන බඳ | 15% |
| 115 | 8707.10.30 | සීට් සහ කවර හැර, කොටස් හා උපාංග වලින් පූර්ණ වශයෙන් සමන්විත භාවිත කළ වාහන | 15% |
| 116 | 8707.10.40 | සීට් සහ කවර හැර කොටස්හාඋපාංගවලින්පූර්ණවශයෙන්සමන්විතඅ නෙකුත් වාහන බඳ | 15% |
| 117 | 8707.10.50 | රළු අලේපිත, දොරවල් ,බොනට්ටුව සහ ඩිකි වැස්ස සහිත /රහිත බඳේ සැකිල්ල | 15% |
| 118 | 8707.10.60 | දොරවල් ,බොනට්ටුව සහ ඩිකි වැස්ස සහිත /රහිත භාවිත කළ බඳේ සැකිල්ල | 15% |
| 119 | 8707.10.90 | අනෙකුත් | 15% |

| | | | |
|---|---|---|---|
| 120 | 8707.90.41 | කොටස් හා උපාංග වලින් පූර්ණ වශයෙන් සමන්විත භාවිත කළ බඳ | 15% |
| 121 | 8707.90.42 | කොටස්හාඋපාංගවලින්පූර්ණවශයෙන්සමන්විතඅ නෙකුත් වාහන බඳ | 15% |
| 122 | 8707.90.43 | ෂීට් සහ කවර හැර, කොටස්හාඋපාංගවලින්පූර්ණවශයෙන්සමන්විතභා විත කළ වාහන බඳ | 15% |
| 123 | 8707.90.44 | ෂීට් සහ කවර හැර, කොටස්හාඋපාංගවලින්පූර්ණවශයෙන්සමන්විතඅ නෙකුත් වාහන බඳ | 15% |
| 124 | 8707.90.48 | රළු අලේපිත, දොරවල් ,බොනට්ටුව සහ ඩිකි වැස්ස සහිත /රහිත බඳේ සැකිල්ල | 15% |
| 125 | 8707.90.49 | දොරවල් ,බොනට්ටුව සහ ඩිකි වැස්ස සහිත /රහිත භාවිත කළ බඳේ සැකිල්ල | 15% |
| 126 | 8712.00.20 | භාවිතා කරන ලද පාපැදි | 30% හෝ ඒකකයට රු. 3000/- |
| 127 | 8714.99.91 | අලුත් ටයර් සවිකරන ලද පාපැදි රිම් | 30% |
| 128 | 8714.99.92 | ගෙවී ගිය සලකුණු පෙන්වන ටයර් සවිකළ යතුරු පැදි රිම් | 30% |
| 129 | 8714.99.99 | අනෙකුත් | 15% |
| 130 | 8903.92.10 | දිය මතුපිට යාහැකි යතුරුපැදි බඳු (Jet Ski) බෝට්ටු | නිදහස් |
| 131 | 8903.92.90 | අනෙකුත් | 30% |

***මූලාශ්‍රය: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016***

**ඇමුණුම- II**

**වගුව 4.2 - 1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ ආඥා පනත (රේගු ආනයන තීරුබදු)**

| අනු පිළිවෙල | ආදායම් සංරක්ෂණ ආඥා පනත අංකය/විස්තරය | ගැසට් අංකය හා දිනය | බලාත්මක දිනය | විස්තරය |
|---|---|---|---|---|
| 1 | RPO/01/2016 | 1952/10 - 2016.02.01 | 2016.02.01 | හාල් සඳහා වූ ආනයනික රේගු බදු කි. ග්‍රෑම් 1ක් සඳහා රු. 35/- සිට රු.50/- දක්වා වැඩි කර ඇත. |
| 2 | RPO/02/2016 | 1971/23 - 2016.06.16 | 2016.06.17 | පාම් ඔලේන් සඳහා නව සංයෝජිත වර්ගීකරණ ජාතික උප බෙදීම් සකස් කර ඇත. |
| 3 | RPO/03/2016 | 1979/45 - 2016.08.12 | 2016.08.13 | පොලිෂොප්ලින් බෑග් සඳහා ආනයනික තීරු බදු 15% දක්වා වැඩි කර දේශීය කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම. |
| 4 | RPO/04/2016 | 1981/44 - 2016.08.24 | 2016.08.25 | එතනොල්වල ආනයනික තීරු බදු ලීටරයට රු. 400/- සිට රු.500/- දක්වා වැඩි කිරීම |

| | | | | |
|---|---|---|---|---|
| 5 | RPO/05/2016 | 1984/25 - 2016.09.14 | 2016.09.15 | තිරිඟු ධාන්‍ය සඳහා ආනයනික තීරු බදු කි. ග්‍රෑම් 1ක් සඳහා රු. 10/- සිට රු.12/- දක්වා වැඩි කිරීම |
| 6 | RPO/06/2016 | 1992/26 - 2016.11.10 | 2016.11.11 | 2017 අයවැය යෝජනා අනුව එතනෝල්වල ආනයනික බද්ද ලීටරයට රු. 500/- සිට රු. 800/- දක්වා වැඩි කිරීම, ලෝක වෙළඳ සංවිධානය හා එකඟ වී ඇති උපරිම බදු සීමාව ඉක්මවා ඇති අයිතම 96ක බදු එකී ගිවිසුම ප්‍රකාරව සංශෝධනය කිරීම, කර්මාන්ත සඳහා අවශ්‍ය මූලික අමුද්‍රව්‍යවල බදු අඩු කිරීම හා වෙළඳ ප්‍රජාවගේ අවශ්‍යතාවය අනුව නව සංයෝජිත වර්ගීකරණ උප බෙදුම් සකස් කිරීම |
| 7 | RPO/07/2016 | 1995/37- 2016.12.02 | 2016.12.03 | ලිහිසි තෙල් සඳහා වූ ආනයනික තීරු බදු 30% සිට 15% දක්වා අඩු කිරීම හා යකඩ අමුද්‍රව්‍ය කුට්ටි සඳහා වූ බද්ද කි. ග්‍රෑම් 1ක් සඳහා රු. 8/- ක් ලෙස සංශෝධනය කිරීම ( අයවැයෙන් පසු සිදු කරන ලද සංශෝධිත ගැසට් පත්‍රය) |

***මූලාශ්‍රය: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016***

වගුව **4.3** රේගු ආඥා පනත (235 අධිකාරය) යටතේ සිදු කළ වෙනස්කම්

| අනු පිළිවෙල | නීතිමය තත්ත්වය | ගැසට් අංකය හා දිනය | බලපැවැත්වෙන දිනය | විස්තරය |
|---|---|---|---|---|
| 1. | රේගු ආඥා පනතේ (සංශෝධිත) (ඉ) උපලේඛනයේ 10වන ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන නියෝග | 1. 1956/17 - 2016.03.01 | 2016.03.01 | මෝටර් රථ සඳහා රේගු වටිනාකම තීරණය කිරීමේ ක්‍රමවේදය සංශෝධනය කිරීම |
| | | 2. 1967/53 – 2016.05.19 | 2016.05.19 | සියයට සියයක්ම රේගු බදුවලින් නිදහස්ව ආනයනය කරන ලද මෝටර් රථ දේශීය වෙළඳපලට නිකුත් කිරීම සඳහා ක්ෂය වටිනාකම් ප්‍රකාශයට පත් කිරීම ( රාජ්‍ය තාන්ත්‍රිකයින් හා රාජ්‍ය තාන්ත්‍රික ආයතන) |
| | | 3.. 1976/5 - 20.07.2016 | 2016.07.20 | |
| | | 4.1986/56 - 2016.09.29 | 2016.09.29 | |
| | | 5. 1981/34 – 2016.08.23 | 2016.08.23 | ප්‍රති අපනයනය සඳහා ආනයනය කරන ලද යන්ත්‍ර සූත්‍ර දේශීය වෙළඳපලට නිකුත් කිරීමේදී රේගු වටිනාකම් තීරණය කිරීම |
| 2. | 101 කොටස යටතේ රෙගුලාසි | 1. 1968/11 - 2016.05.25 | 2016.05.26 | මෝටර් රථ සඳහා රේගු වටිනාකම් ගණනය කිරීමේ ක්‍රම වේදය සංශෝධනය කිරීම |
| | | 2.. 1971/10 – 2016.06.14 | 2016.06.14 | |
| | | 3. 1992/28 - 2016.11.10 | 2016.11.11 | රේගු වටිනාකම් ගණනය කිරීමේදී නැව්භාර ගාස්තු තීරණය කිරීම |
| | | 4.. 1994/48 - 2016.11.23 | 2016.11.23 | |

***මූලාශ්‍රය: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016***

වගුව **4.4** විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත් අංක **48/2007** යටතේ බදු සංශෝධනය කිරීම්

| අනු පිළිවෙල | ගැසට් අංකය හා දිනය | අයිතමය | බදු සංශෝධනය |
|---|---|---|---|
| 1 | 1950/30 – 2016.01.20 | උම්බලකඩ, හාල් මැස්සන්, මුං ඇට, උඳු, මිරිස්, කොත්තමල්ලි, කහ, උදුපිටි, ටින්මාළු | විශේෂ වෙළඳ භාණ්ඩ බදු 2016 ජනවාරි 21 දින සිට තවත් මාස 06ක් සඳහා දීර්ඝ කිරීම |
| 2 | 1951/28- 2016.01.28 | බඩ ඉරිගු, එළවළු මේදය | බඩ ඉරිගු සඳහා නියම කළ බදු වල වලංගු කාලය 2016 ජනවාරි 29 දින සිට 2016 පෙබරවාරි 29 දක්වා දීර්ඝ කිරීම හා එළවළු මේදය සඳහා 2016 ජනවාරි 29 දින සිට 2016 අප්‍රේල් 28 දක්වා දීර්ඝ කිරීම |
| 3 | 1956 /10 – 2016.02.29 | අර්තාපල්, ලොකු ළූණු | 2016 මාර්තු මස 01 වැනි දින සිට මාස 04ක කාලයක් සඳහා වලංගු වන පරිදි අර්තාපල් සඳහා බදු ප්‍රමාණය කි. ග්‍රෑ. 1ට රු. 15/- සිට රු. 35/- දක්වාත් ලොකු ළූණු සඳහා බදු ප්‍රමාණය කි. ග්‍රෑ. 1ට රු. 5/- සිට රු. 25/- දක්වාත් වෙනස් කිරීම |
| 4 | 1957/5 – 2016 .03.08 | මැකරල් මාළු, වටාන, කඩල, කව්පි,කුරක්කන්, මාගරින්, සීනි,එළවළු තෙල් | වලංගු කාලය 2016 මාර්තු 08 දින සිට මාස 06ක් සඳහා දිර්ඝ කරන ලදී |
| 5 | 1960/59 – 2016.04.01 | කරවල, යෝගට්, බටර්, රතු ළූණු, සුදු ළූණු, දොඩම්, මිදි, ඇපල්, සුදුරු, මහදුරු, උළු හාල්, කුරක්කන්, රටකජු, අබ ඇට, ලූණු (භාණ්ඩ 15 සඳහා) | වලංගු කාලය 2016 අප්‍රේල් 02 දින සිට මාස 06ක් සඳහා දිර්ඝ කරන ලදී |
| 6 | 1966/26 – 2016.05.12 | එළවළු තෙල්, මාගරින් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2016 මැයි 13 සිට කි.ග්‍රෑම් 1ක් රු. 20/- දක්වා වැඩි කිරීම |
| 7 | 1967/57 – 2016.05.20 | මාළු, රතු ළූණු, පරිප්පු, රට ඉඳි, සුදුරු, මහදුරු | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රතු ළූණු මත කි.ග්‍රෑම් 1ක් රු. 5/- සිට රු. 25/- දක්වා සහ මහදුරු මත රු. 52/- සිට රු. 162/- දක්වා වැඩි කර අනෙකුත් අයිතම සඳහා වලංගු කාලය 2016 මැයි 21 සිට මාස 06කට දීර්ඝ කරන ලදී |
| 8 | 1971/22 – 2016.06.16 | එළවළු තෙල්, මාගරින් | දේශීය පොල් කර්මාන්තය ආරක්ෂා කිරීමට විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2016 ජුනි 17 සිට මාස 06ක් සඳහා කි.ග්‍රෑම් 1ක් සඳහා රු. 20/- කින් වැඩි කරන ලදී |

| | | | |
|---|---|---|---|
| 9 | 1973/61 – 2016.06.30 | අර්තාපල්, ලොකු ළූණු, බඩ ඉරිගු | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද බඩ ඉරිගු මත කි.ග්‍රෑම් 1ක් සඳහා 10%ක් පනවන ලදී. අර්තාපල්, ලොකු ළූණු මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2016 ජූලි 01 සිට තවත් මාස 03ක් දීර්ඝ කරන ලදී. |
| 10 | 1976/ 4 - 2016.07.18 | උම්බලකඩ, හාල්මැස්සන්, මුං ඇට, උඳු, මිරිස්, කොත්තමල්ලි, කහ, උඳු පිටි, ටින් මාළු, සීනි | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සීනි මත කි.ග්‍රෑම් 1ක් සඳහා රු. 30/- සිට රු. 25/- දක්වා අඩු කර වලංගු කාලය 2016 ජූලි 19 සිට මාස 06ක් දීර්ඝ කරන ලදී. අනෙකුත් අයිතම සඳහා එය 2016 අප්‍රේල් 02 සිට වලංගු වේ. |
| 11 | 1980/37 - 2016.08.19 | ලොකු ළූණු | දේශීය ගොවීන් ආරක්ෂා කිරීම සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කි.ග්‍රෑම් 1ක් සඳහා රු. 25/- සිට රු. 40/- දක්වා වැඩි කර මාස 06ක් සඳහා වලංගු වන පරිදි 2016 අගෝස්තු 25 සිට ක්‍රියාත්මක කරන ලදී. |
| 12 | 1981/46 - 2016.08.24 | අර්තාපල් | දේශීය ගොවීන් ආරක්ෂා කිරීම සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කි.ග්‍රෑම් 1ක් සඳහා රු. 35/- සිට රු. 40/- දක්වා වැඩි කර වලංගු කාලය 2016 අගෝස්තු 25 සිට මාස 06ක් දීර්ඝ කරන ලදී. |
| 13 | 1983/13 – 2016.09.07 | මැකරල් මාළු, වටාන, කඩල, කව්පි,කුරක්කන් | වලංගු කාලය 2016 සැප්තැම්බර් 08 සිට මාස 06ක් දීර්ඝ කරන ලදී. |
| 14 | 1984/26 – 2016.09.15 | සීනි | දේශීය සීනි කර්මාන්තය ආරක්ෂා කිරීමට විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රතු සීනි මත කි.ග්‍රෑම් 1ක් සඳහා ශත 25 සිට රු. 15/- දක්වා සහ සුදු සීනි මත කි.ග්‍රෑම් 1ක් සඳහා ශත.25 සිට රු. 2/- දක්වා වැඩි කර වලංගු කාලය 2016 සැප්තැම්බර් 16 සිට මාස 06ක් බවට පත් කරන ලදී. |
| 15 | 1986/55 – 2016.09.29 | පරිප්පු | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පියළි නොකරන ලද පරිප්පු මත කි.ග්‍රෑම් 1ක් සඳහා ශත.25 සිට රු. 5/- දක්වා සහ පියළි කරන ලද පරිප්පු මත කි.ග්‍රෑම් 1ක් සඳහා ශත.25 සිට රු. 10/- දක්වා වැඩි කර වලංගු කාලය 2016 සැප්තැම්බර් 30 සිට මාස 06ක් බවට පත් කරන ලදී. |
| 16 | 1986/66 – 2016.09.30 | කරවල, යෝගට්, බටර්, සුදු ළූණු, දොඩම් මිදි, ඇපල්, උළු හාල්, කුරක්කන්, රටකජු, අබ ඇට, ලුණු (භාණ්ඩ 12 සඳහා) | වලංගු කාලය 2016 ඔක්තෝම්බර් 02 සිට මාස 06ක් දීර්ඝ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| 17 | 1992/9 – 2016.11.07 | මාළු, මුං ඇට, මැංගුස්, වියළි දොඩම්, පෙයාස්, චෙරි, වියළි මිදි, කිවි පළතුරු සහ දෙළුම් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාළු මත 10% හෝ කි.ග්‍රෑම් 1ක් සඳහා රු. 50/- සිට 10% හෝ කි.ග්‍රෑම් 1ක් සඳහා රු. 75/- දක්වාද මුං ඇට සඳහා කි.ග්‍රෑම් 1ක් සඳහා රු. 10/- සිට කි.ග්‍රෑම් 1ක් සඳහා රු. 40/- දක්වාද වැඩි කර ඇත. තවද පලතුරු වර්ග 06ක් සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2016 නොවැම්බර් 08 සිට හඳුන්වා දෙන ලදී. |
| 18 | 1992/27 – 2016.11.10 | සීනි | 2016 නොවැම්බර් 11 සින සිට ක්‍රියාත්මක වන පරිදි සුදු සීනි මත බද්ද කි. ග්‍රෑමයට රු. 2/- සිට රු. 7/- දක්වා වැඩි කරන ලදී (අයවැය යෝජනා 2017) |
| 19 | 1994/20 – 2016.11.21 | රතු ළූණු, රට ඉඳි, සුදුරු, මහදුරු | වලංගු කාලය 2016 නොවැම්බර් 21 සිට මාස 06ක් දීර්ඝ කරන ලදී. |
| 20 | 1996/50 – 2016.12.09 | එළවළු තෙල්, මාගරින් | පාම් තෙල් මත කි. ග්‍රෑමයට රු. 170/- සිට රු. 175/- දක්වා වැඩි කිරීම සහ අනෙක් එළවළු තෙල් සඳහා වලංගු කාල සීමාව 2016 දෙසැම්බර් 10 දින සිට මාස 06කට දීර්ඝ කිරීම |
| 21 | 1998/5 – 2016.12.20 | බඩ ඉරිගු<br>සීනි | බඩ ඉරිගු මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කි. ග්‍රෑමයට රු. 10/-ක් නැවත පැනවීම සහ සුදු සීනි සඳහා කි. ග්‍රෑමයට රු. 7/- සිට රු. 13/- දක්වා 2016 දෙසැම්බර් 20 සිට වැඩි කිරීම |

***මූලාශ්‍රය: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2016***